# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් www.budusarana.lk email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ වප් පුර අටවක පෝ දා, 2021 ඔක්තෝබර් 13 බදාදා BUDUSARANA WEDNESDAY OCTOBER 13, 2021

56 කාණ්ඩය, 16 පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 20 මිල රු. 40.00




මැදිරිගිරිය වටදාගෙය

ඡායාරූපය - සමන්ත වීරසිරි

# ජීවිතය එපා වන තරමට ඇති හිතේ බර බිමින් තබන්නේ මෙහෙමයි

**මෙත් සිත පුදුමාකාර ය. එය සිතෙහි වැඩෙන්නට, වැඩෙන්නට සිත නිවෙන්නේ ය. සන්සුන් වන්නේ ය. සුවපත් වන්නේ ය. මෙත් සිත ඇති තැන වෛරයට, ක්‍රෝධයට, නොරුස්නා බවට, අමනාපයට ඉඩක් නැත. එපමණක් ද නොවේ. අසීමිත ලෝභය, අසීමිත රාගය , අසීමිත ආශාව ආදී කරදරකාරී සිතිවිලිවල ද පාලනයක් ඇතිවීම ආරම්භ වේ. ඒ තුළ සිත පිරිසුදු වේ. සිතෙහි ඇතිවන මෙම පිරිසුදු බව නිසා ලැබෙන අනුසස් එකොළහක් පිළිබඳ ව මෙත්තානිසංස සූත්‍රයෙහි පෙන්වා දී ඇත.**

පළමුව ලැබෙන ලාභය නම් සුව නින්දක් ලැබීම ය. සිතෙහි තරහකින්, වෛරයකින්, බලවත් ආශාවකින් හෝ බලාපොරොත්තු කඩවීමකින් වේදනාවක් දැනෙන මොහොතක සුව නින්දකට අවස්ථාව නො ලැබේ. නින්දට බාධා ඇතිවේ. මහ රැයෙහි ද නිදි නොමැති ව විවිධ සිතිවිලිවලින් සිත පීඩාවට පත් වේ. විවිධ කල්පනාවන් ඇති වේ.

"මේ ප්‍රශ්න මට හරි ම වදයක්. මතක් වෙනවිට නින්ද යන්නේ නැහැ"

ඇතැම් කෙනෙක් එසේ කියන අවස්ථා බොහෝ ය.

එහෙත් මෙත් සිතිවිලි පුරුදු කරන කෙනකුගේ සිතට නිතර ම පැමිණෙන්නේ ද මෙත් සිතිවිලි ම ය. සෑම දෙනා කෙරෙහි මෙන් ම, පැමිණෙන සියලු ගැටලු දෙස ද කරුණාවෙන් මෙන් ම සන්සුන් මනසකින් බැලීමට එවැනි කෙනකුට හැකි වන්නේ ය.

මෛත්‍රිය පුරුදු නැති සිත, විමසා බැලීමකින් තොරව ඉක්මන් තීරණ ගනී. ඒ වගේ ම ඉක්මනින් කේන්තියට පත්වෙයි. ඒ තත්වය කෙළවර වන්නේ ඇතැම්විට තමන්ගේ ජීවිතය මෙන් ම, අන් අයගේ ජීවිත ද විනාශ වීමෙන් විය හැකි ය. වර්තමානයේ බොහෝ විවාහ ජීවිත බිඳී විසිරී යන ආකාරය අපි දකිමු. පවුල් පරිසරයේ සිට සෑම තැනක ම ඇතිවන බොහෝ ගැටලුවලට මුල ජීවිතයට මෛත්‍රිය පුරුදු කර නො තිබීම ය.

" මේ බර ඔළුවේ තිබෙනතාක් මට නින්ද යන්නේ නැහැ."

"මේ බරින් නිදහස් වූ දවසක තමයි මට නින්ද යන්නේ."

අප අතර ම සිටින කොපමණ පිරිසක් නම් මෙවැනි වදන් පවසනවා ද?

ඇතැම් කෙනකුගේ සිතේ බර තිබෙන්නේ පවුලේ ගැටලු හෝ අවුල් වියවුල් හේතුවෙනි. තවත් කෙනකුගේ බර රැකියාව හෝ ගේ දොර සාදා ගැනීම පිළිබඳ ව ය. තවත් කෙනකුගේ සිතට බර දැනෙන්නේ දරුවන් නිසා ය. මේ ආකාරයෙන් කුමන හෝ හේතුවක් නිසා තම සිත පීඩාවට ලක්වන විට එය හිසට බරක් යැයි නොසිතන කෙනෙක් නැති තරම් ය. ඒ අත්දැකීම ඔබට ද ආගන්තුක නොවිය හැකි ය. එසේ වූවා යැයි ඒ බර බිමින් තබන්නට නම් උත්සාහ ගන්නා අය දුලබ ය. බොහෝ විට අප සිතට ගන්නේ අනවශ්‍ය බර ය. වියදමක් නොදරා ම ඒ බර බිමින් තැබිය හැකි වූව ද, ඊට උනන්දුවක් නො ගෙන ම බොහෝ දෙනා පුරුදු වී සිටින්නේ මැසිවිලි නගන්නට ය. ඒ තුළ ද නිර්මාණය වන්නේ බරක් ම මිස සැහැල්ලුවක් නොවන බව අවබෝධ කර ගත යුතු ම ය. මෙසේ දුක් පීඩා විඳින අය අතර ම තවත් අපූරු පිරිසක් සිටී. ඔවුන් පවසන්නේ මෙවැනි වදන් ය.

"වෙනදාට නම් ඕනෑම දේකට මම ඉක්මනින් ම කලබල වෙනවා දැන් නම් එහෙම වෙන්නේ නැහැ. මට දැන් ඉවසන්න පුළුවන්." මෙවැනි තැනකට සිත හදාගන්නට පුළුවන් නම්, මොනතරම් වටිනවා ද? ඒ, සැහැල්ලු බව ජීවිතයට මොන තරම් සැහැල්ලුවක් ගෙන දෙනවා ද?

මෙත් සිතිවිලි වැඩීමේ දෙවැනි ආනිශංසය සුව සේ නින්දෙන් පිබිදීමට හැකි වීම ය. සමහර අය උදෑසන නින්දෙන් පිබිදෙන්නේ ම දවසට ම දෙස් තබමිනි. "අද මොන කරුමක්කාර දවසක් ද දන්නේ නහැ." "තව ටික වේලාවක් නිදාගන්න තිබුණ නම් හොඳයි", "ඊයේ රෑ පුරා ම නින්ද ගියේ නැහැ." "අදත් වැඩ කන්දක් "' මේ සේරම වැඩ කොහොම කරගන්න ද කියා සිතා ගන්නවත් බැහැ." මේ ආකාරයෙන් අමනාප සිතිවිලි ඇති කර ගෙන දවස ආරම්භ කිරීමෙන්, කාලය කා දමන අය මොනතරම් ද? එසේ ගෙවී යන කාලය ඇතුන්ලවාවත් ඇද්දවීමට නම් නොහැකි ය. දවස අසුබ වන්නේ, දවසේ වැරැද්ද නිසා නම් නොවේ. තමන්ගේ සිතේ ඇති කර ගත් වැරැද්ද නිසා ය.

තවත් කෙනෙක් උදෑසන නින්දෙන් පිබිදී දවස ආරම්භ කරන්නේ නිවසේ ම කෙනෙකුට කෑ ගසමින්, දෙස් තබමින් ය. ඊළඟට කාමරයේ, නාන කාමරයේ, වැසිකිළියේ පටන් දොර ජනේල ශබ්ද නගා වසන්නටත්, කෝප්ප, පිඟන් හඬ නංවමින් එහා මෙහා දමන්නටත් පටන් ගනී. සුබ දවසක් බවට පත්කර ගැනීමට හැකි දවස අසුබ දවසක් බවට පත් කර ගන්නේ අප විසින් ම ය. මෙලෙස සිදු වන්නේ සිත මෛත්‍රියෙන් බැහැර වූ විට ය.

මෙත් සිත් ඇති තැන නපුරු හා පාපී සිහින නො පෙනීම තවත් ආනිශංසයකි. සිහින පෙනෙන්නේ අපගේ යටි සිත නින්දේ දී ක්‍රියාත්මක වීමෙනි. මෛත්‍රිය මැනවින් නො වැඩුණු සිත්වල ඇති වන දැඩි රාග, ද්වේෂ, මෝහ ආදී සිතිවිලි සිතේ තැන්පත් ව පවතියි. බොහෝ කෙනකුට මේවා නින්දේදී මතු වන්නට පටන් ගනී.

නපුරු හා භයානක සිහින දැක බියට පත් වී නින්දෙන් පිබිදුණු විට "ඉතිපිසෝ භගවා" ගාථාව හෝ කරණීය මෙත්ත සූත්‍රය සජ්ඣායනා කොට නැවතත් නින්දට යන්නට යැයි පවසන්නේ මේ නිසා ය. මෙත් සිතිවිලි ඇති කර ගැනීම මෙහි මූලික බලාපොරොත්තුව යි. නින්දේදී බිය වන නපුරු සිහින දකින අයට ලබා දිය හැකි වටිනා ම ඖෂධය වන්නේ "කරණීය මෙත්ත සූත්‍රය" මැනවින් සජ්ඣායනය කර නින්දට යැමයි.

"මනුස්සානං පියෝහෝති" මෛත්‍රිය වැඩීම හේතුවෙන් ලැබෙන තවත් උතුම් ම පලයක් වන්නේ මිනිසුන්ට ප්‍රිය වීමය. යම් කෙනකුගේ සිත මෛත්‍රියට පුරුදු වීමෙන් සිතන හා දකින ආකාරය ද, කතා කරන වචනය ද, කරන ක්‍රියාව ද පවුලට මෙන් ම සමාජයේ අන් අයට කරදර හා පීඩා නොවන්නක් බවට පත්වේ.


"අන් අයට මොනවා වුණත් මට කමක් නැහැ. මගේ බඩ කට පිරෙනවා" නම් වූ අයහපත් සිතිවිල්ලෙන් බැහැර ව, තමා වටා මෙන් ම සමාජයේ අන් අය ගැනත්, සිතන සත්පුරුෂ මිනිසෙක් බවට පත්වෙයි. කෙසේ හෝ අන්සතු යමක් කඩාවඩා ගැනීමට උත්සාහ නො කරන මිනිසෙක් බවට පත්වෙයි. අන් අයගේ ඇද කුද සොයන, කවදාවත් අනුන්ගේ හොඳක් නොදකින හා නොකියන අසත්පුරුෂ ස්වභාවයට පත් නොවෙයි. ඇසුරු කරන අයගෙන් යමක් බලාපොරොත්තු නොවී, කුමක් හෝ උපකාරයක් ඔවුන් වෙනුවෙන් කිරීමට උත්සාහ ගනියි. මේ උතුම් මානුෂික ගුණාංග ක්‍රමයෙන් මනුෂ්‍ය ජීවිතයට පුරුදු වන්නේ මෛත්‍රිය සමඟිනි.

මේ හේතුව නිසා ම ඒ පුද්ගලයා සමාජයේ ප්‍රියශීලී අයෙක් බවට පත්වෙයි. ඒ වගේ ම ගුණ යහපත් කෙනෙක් යන අපූර්ව සහතිකය ද ඒ පුද්ගලයාට ලැබෙයි. ඒ, පුද්ගලයා මනුෂ්‍යයන්ට පමණක් නොවෙයි. අමනුෂ්‍යයන්ට ද ප්‍රිය වෙයි.

අඩුම තරමේ රාත්‍රී නින්දට යැමට පෙර “කරණීය මෙත්ත සූත්‍ර යේ අදහස සිතට ගෙන සජ්ඣායනා කිරීමේ පුරුද්ද හෝ ඇති කර ගන්න. ඒ පුරුද්ද තුළ ටිකෙන් ටික මෛත්‍රී සිතිවිලි වැඩෙන්නට පටන් ගනු ඇත. ඉන් පසු සෑම දිනක ම අවංක සිතින් සුළු වේලාවක් හෝ මෛත්‍රී භාවනාව වඩන්නට යොමු වනවා නම් , ඒ තුළ ඔබ ලබන සැනසීම ජීවිතයේ මෙලොව පරලොව දියුණුවට බොහෝ සෙයින් ම හේතු වනු ඇත.



දීපා පෙරේරා



# ජීවිතයට රැකවරණය දෙන සදහම් මාවත

*අයසාව මලං සමුට්ඨිතං - තදුට්ඨාය තමෙව ඛාදති*
*එවං අතිධොනචාරිනං - සකකම්මානි නයන්ති දුග්ගතිං*

> "යකඩයක මහත් ශක්තියක් පවතින්නාක් මෙන් යම් කෙනකු තුළ මහත් බලයක් පවතී. ඇදහීම, විශ්වාසය හා පැහැදීම ඇති කරන ශ්‍රද්ධා නමැති බලය එයින් එකකි. නො පසුබස්නා වීර්යය තවත් එකකි. මනා සිහිය සහ සිතෙහි එකඟතාව නම් වූ සමාධිය නමින් දැක්වෙන්නේ තවත් බල දෙකකි."

**යකඩයක් තුළ හට ගෙන එයින් ම මතු වූ මලය ඒ යකඩය ම කා දමයි. එසේ ම නුවණින් තොරව වසන තැනැත්තාගෙන් සිදුවන අකුසල කර්මයන් ඔහු දුගතියට පමුණුවති යනු ඉහත සඳහන් ගාථාවෙහි සරල අදහස යි.**

මෙහි යකඩය පුද්ගලයකුට සමාන කොට ඇත. කෙනෙකු සිදු කරන වැරදි හෙවත් අකුසල ක්‍රියා යකඩයෙන් ම පැන නඟින මලයන්ට සමාන කරයි. ගාථාවෙහි අයසා යන වචනයෙන් දැක්වෙන්නේ යකඩය යි. එය අතිශයින් වැදගත් ලෝහ විශේෂයකි. ඕනෑම සත්වයකුගේ ශරීරයක් නීරෝගී සම්පන්න ව, යහපත් ව පැවතීමට නම් ඛනිජ ලවන, විටමින්, පිෂ්ට ධාතු ආදිය මෙන් ම යකඩ ද අවශ්‍ය බව වෛද්‍ය ශාස්ත්‍රයෙහි දැක් වේ. එයිනුත් යකඩ හේතු කොට ගෙන ආයුෂ, වීර්යය, මදය වර්ධනය කරන බවත්, රෝග නැසීමේ ශක්තියක් එහි ඇති බවත් පෙර දිග වෛද්‍ය ශාස්ත්‍රයෙහි සඳහන් වේ.

සරු සාරවත් වූ ගසක හටගෙන වැඩෙන්නා වූ පිළිලයකට එම ගස වැනසීමේ ශක්තිය ඇත. එමෙන් මහත් ශක්තියක් ඇති යකඩය වුවත් කා දමා සියලු බල වනසා දැමීමට ඒ තුළින් පැන නඟින මලකඩවලට හැකියාව ලැබෙයි.

යකඩයක මහත් ශක්තියක් පවතින්නාක් මෙන් යම් කෙනකු තුළ මහත් බලයක් පවතී. ඇදහීම, විශ්වාසය හා පැහැදීම ඇති කරන ශ්‍රද්ධා නමැති බලය එයින් එකකි. නො පසුබස්නා වීර්යය තවත් එකකි. මනා සිහිය සහ සිතෙහි එකඟතාව නම් වූ සමාධිය නමින් දැක්වෙන්නේ තවත් බල දෙකකි. ප්‍රඥාව ද ඇතුළත් මේ පංච බලය ඕනෑම කෙනකුගේ ජීවිතයක් සාර්ථක කිරීමට පුදුම ශක්තියක් ලබා දෙයි.

සැප සම්පත් සියල්ල නැති කොට කෙනකුට විපත් පමුණුවන මල වශයෙන් දැක්වෙන්නේ අප තුළ පවතින කෙලෙස් ය. සසර වසන තුරු අප තුළ පැළපදියම් වී පවතින මේ කෙලෙස් නිසා ම අප අකමැති වූ ජරා, ව්‍යාධි, මරණ, දුක්, දොම්නස් නිරන්තරයෙන් අප කෙරෙහි බලපායි. බුද්ධිමත් ව සිතන විට පෙනී යන්නේ අප තුළ ම රැඳී සිටින ඒ කෙලෙස් මල අපගේ ම සතුරන් හා සමාන බවයි.

තම භාර්යාව පසේ බුදුවරයකුට පිළිගන්වා තිබූ ආහාර පිළිබඳ ඇති වූ ලෝභ සහගත හැඟීම නිසා අප බුදුරදුන් කල අපුත්තක සිටාණන් යැයි ප්‍රසිද්ධ ව සිටි මහා ධන කුවේරයාට බඩට හරිහැටි අහරක් නොමැතිව දුක් විඳින්නට සිදු වූ බව ධර්ම ග්‍රන්ථ පැහැදිලි කර දෙයි. තම වස්තුව කෙරෙහි ඇති වූ අධික ආශාව නිසා තෝදෙය්‍ය නමැති බමුණා මිය ගොස් තිරිසන් ආත්මයක් ලබා ගත් බව තවත් ප්‍රකට සිදුවීමකි. සිවුරකට ආසා කළ තිස්ස නමැති භික්ෂු නම මිය ගොස් එකී සිවුරෙහි ඉණිකුණකු ව උපත ලැබීමේ පුදුම හා වේදනා සහගත සිදුවීම නිමිති කොට මුලින් සඳහන් කළ ගාථාව බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත. මේ සියලු විපත්වල වගකීම අන් කෙනකුට නොව ඔවුන් වෙත ම පැවරේ.

ආශාවෙන් බර වූ මනුෂ්‍යයා කෑම බීම්, ගේ දොර, ඇඳුම් පැළඳුම් කෙරෙහි අනවශ්‍ය කැදරකමක් දක්වා ක්‍රියා කරයි. ලෞකික සම්පත් කෙරෙහි දැඩි ලෙස ඇලෙයි. කොපමණ ඉන්ද්‍රියයන් පිනවුවත් ඔහු තෘප්තියක් ලබා නො ගනී.

බුද්ධිමත් තැනැත්තා සීත, උෂ්ණ ආදිය හා මැසි මදුරු උවදුරු ආදිය වළකා ගැනීමේ පරමාර්ථයෙන් ගේ දොර සාදා ඇඳුම් පැළඳුම් භාවිත කරයි. අනුන් මැඩීම පිණිස නොව සා පිපාසා දුරු කොට නිරෝගී සම්පන්න ජීවිතයක් ගෙවමින් කුසල දහම් සම්පූර්ණ කිරීම උදෙසා ශරීරය පවත්වාගෙන යාමට ආහාර පාන මෙන් ම බෙහෙත් හේත් ලබා ගැනීමට කැමති වෙයි. මේ අන්දමට ගින්නෙන් මෙන් ම විදුලියෙන් ද ආරක්ෂා වී තමා ගේ බලාපොරොත්තු ඉටු කර ගන්නා ඥානවන්තයකු ලෙස කටයුතු කළ හොත් අප තුළ කෙලෙස් මල මතුවිය නො හැකි ය. දුගතියකට නො වැටීමට ඇති එකම මඟ මේ අන්දමට කෙලෙස් මල සිඳ දැමීම බව සිතට ගත යුතු ය.



කොළඹ ආනන්ද විද්‍යාලයේ
විශ්‍රාමික සහකාර විදුහල්පති
සද්ධර්ම කීර්ති ශ්‍රී ත්‍රිපිටකාචාර්ය
**දිවියාගහ යසස්සි නා හිමි**



# මානසික ආතතිය නිසා වැඩි වශයෙන් පීඩා විඳින්නේ ඉවසීම නැති අය යි

**නිසලව ගලන ගංගාවකට වඩා ගල්පර බාධක මැඩ ගනිමින් ගලන ගංගාව පියකරු ය. සුන්දර ය. ගල්පරවල හැපුණ ද සියලු බාධක මැඩගෙන ගංගාව තම ගමනාන්තය තෙක් ම ගමන් කළ යුතු ය. අපගේ ජීවිතය නැමැති ගංගාව එබඳු ය.**

උපතේ සිට මරණය දක්වා ජීවිතයේ ගෙවී යන සෑම දවසක් ම අප බලාපොරොත්තු වන ආකාරයට උදා නොවෙයි. අප බලාපොරොත්තු වන දේට වඩා නොසිතූ දේට මුහුණ දෙන්නට සිදු වේ. ඇතැම්විට මාස ගණනක් හෝ වසර ගණනක් බලා සිටි දෙය මොහොතින් වෙනස් වීමට ලක් වේ. නොසිතූ ලෙස අභියෝගවලට මුහුණ දීමට සිදුවෙයි. එසේම ඇතැම් විට බලාපොරොත්තු බිඳ වැටීමට තරම් ඇතැම් අවස්ථා උදාවෙයි. අප ඒ සියල්ල ජීවිත අත්දැකීම් ලෙස සැලකීමට පුරුදු විය යුතු ය. එසේ අත්දැකීමට නම් අප එක් දෙයක් පුරුදු කළ යුතු ය. ඒ ඉවසීමයි.

ඛන්ති පරමං තපෝ තිතික්ඛා යන බුද්ධ දේශනාවට අනුව උතුම් ම තපස නම් ඉවසීමයි. යමකුට දුකෙහිදීත්, සැපයේ දී ත් එක සේ ඉවසිය හැකි නම් ඒ උතුම් ම ඉවසීම යි. සමහරවිට ඇතැම්හු තමා අකමැති අත්දැකීමක් අත්විඳීමට සිදු වූ අවස්ථාවන් හි සුළු මොහොතක් එය විඳ දරාගෙන සිට, පසුව එය ප්‍රකෝපකාරී ව පිට කරති. ඇතැම් විට තම ඉවසීමේ සීමාව පන්නන්නට එපා යැයි පවසති. එය ඉවසීම නොවේ. කෝපය මැඩ ගෙන සිටීමකි. නැතහොත් කෝපය සිතෙහි තබා ගෙන, එය කායික ව හෝ වාචසික ව ක්‍රියාත්මක නො කිරීමකි. එසේ නොවී යමකුට එවැනි අවස්ථාවක සිතින් ද එය පාලනය කර ගෙන මැඩලීමට හැකි නම් එය මනා ඉවසීමයි. "ඉවසල ඉවසල බැරිම තැනයි ඉවසිය යුතුම තැන" යනුවෙන් ජනවහරෙහි සඳහන් වන්නේ ද ඒ පිළිබඳ ව යි.

එසේ ම ඇතැම්හු තම දුබල කම නිසා ඉවසති. ඇතැමෙක් තම අනුවණකම නිසා ඉවසන අතර, තව කෙනෙක් ලාභ අපේක්ෂාවෙන් ඉවසති. එය ද මනා ඉවසීම නොවේ. එසේ නම් ඉවසීම යනු කුමක්දැයි හඳුනාගත යුතු ය. බුදුරජාණන් වහන්සේ ඉවසීම යනු කුමක්දැයි දක්වා ඇත්තේ

යම් කෙනෙක් ශීතඋෂ්ණාධිය ද, සාගින්න ද, පිපාසය ද, මැසි මදුරුවන්ගේ, අව් සුළංවල පීඩා ද, සර්පයන්ගේ දෂ්ඨ කිරීම් ද, නොමනා කතා ද, ශරීරයේ හටගන්නා වේදනා ද ඉවසන්නේ නම්, එය ඉවසන්නකුගේ ලක්ෂණ බව යි.

සීතල, උණුසුම , කුසගින්න, පිපාසය ආදී මෙකී සෑම පීඩාවක් ම ජීවිතයේ අප සැමට අත්විඳීමට සිදුවෙයි. ඉගෙන ගන්නා දරුවකුට වුව ද, රැකියාවේ නියුතු වැඩිහිටියකුට වුව ද මේවා පොදු අත්දැකීම් ය. නමුදු ඒවා විඳ දරා ගැනීමට නොහැකි වී නම්, එය ඔහුගේ ජීවිතේ පරාජය යි. ජීවිතය ජය ගැනීමට නම් එසේ සියලු පීඩා විඳ දරා ගැනීමට පුරුදු විය යුතු ය. ඇතැම්හු තම ජීවිතයේ මුහුණ පෑමට සිදුවන අමිහිරි අත්දැකීම් ඉවසීමට නොහැකිවීම නිසා තම ජීවිතයත් පවා අහිමි කර ගැනීමට කටයුතු කරති.

එවැනි දුක්බර කතා පුවතක් මීට වසර කීපයකට පෙර විදෙස් තොරතුරුවලින් අනාවරණය විය. විදේශීය එක්තරා විශ්ව විද්‍යාලයක උසස් අධ්‍යාපනය හැදෑරූ ශ්‍රී ලාංකික තරුණයකු එහිදී වෛද්‍ය වරයකු බවට පත්විය. අධ්‍යාපනය හදාරන කාලය තුළ තමාට මුණගැසුණු ශ්‍රී ලාංකික තරුණියක සමඟ වසර හතක් පමණ ප්‍රේම සම්බන්ධතාවක් පවත්වා යුගදිවියට පත් විය. වෛද්‍යවරියක වූ ඇය සමග පුරා වසර දෙකක් පමණ සතුටින්දිවි ගෙවූ අතර, ඒ කාලය තුළ ඔවුනට කුඩා දරුවකුගේ සුරතල් ද දකින්නට හැකි විය. කාලය සෙමෙන් ගෙවෙන අතර, එක්තරා දිනෙක ඔවුන් දෙදෙනා අතර ඇති වූ බහින්බස් වීමක් දුර දිග යාම නිසා කෝපයට පත් තරුණ වෛද්‍යවරයා තම බිරිඳ හා කිරිකැටි දරුවා මරා දමමින් තමා ද දිවි නසාගත් අවස්ථාවක් පිළිබඳ තොරතුරු අනාවරණය විය. කෙතරම් දැන උගත්කම් තිබුණත් ජීවිතේට එන ගැටලුකාරී තත්ත්වයන්ට ඉවසීමෙන් මුහුණ දීමට නොහැකි නම් එබඳු උගත්කම් ද, අර්ථාන්විත නොවන තරම් ය. මන්ද එවැනි පුද්ගලයන්ගෙන් සමාජයට යහපත් දෑ සිදු වුව ද, ඒවා අභිබවා සිදුවන අයහපත ඉතා පීඩාකාරී ය.

එසේම ජීවිතයේ මුහුණ පෑමට සිදුවන අමිහිරි අත්දැකීම් ඉවසිය නොහැකි බොහෝ දෙනා සියදිවි නසා ගැනීමට පෙළඹීම වර්තමාන ලෝකය පුරාම දක්නට ලැබේ. ඇතැම්හු මව්පිය අවවාද ඉවසා ගන්නට නොහැකිව ද, විභාග ප්‍රතිඵල අපේක්ෂිත තත්වයක නොමැති වීම නිසා ද, ප්‍රේම සම්බන්ධතා බිඳ වැටීම නිසා ද සියදිවි නසා ගැනීමට පෙළඹීමක් දක්නට ඇත. එහි සෑම අවස්ථාවකට ම මූලික හේතුව නො ඉවසීම යි. ජයග්‍රහණයේදී අප සතුටට පත්වනවා සේ ම, පරාජයේදී ද එය උපේක්ෂා සහගත ව විඳදරා ගැනීමට පුරුදු විය යුතු ය. ලෝකයේ විද්වත් සංගමයන් දක්වන ආකාරයට වසරකට ලක්ෂ ගණනක් ලොව පුරා සියදිවි නසා ගන්නා බව වාර්තා කොට ඇත. 2017 වසරේ ලොව රටවල් එකසිය හතක් ගෙන කරන ලද සමීක්ෂණයට අනුව සියදිවි නසා ගන්නා රටවල් අතුරෙන් ශ්‍රී ලංකාව හත් වන තැනට පත්ව ඇති බව සඳහන් කොට ඇත. පැය 24 පුරා ධර්මය පිළිබඳ සාකච්ඡා කරන බෞද්ධ රාජ්‍යයක් ලෙස උදම් අනන අප කොතරම් නම් ආධ්‍යාත්මික අතින් පසුබෑමකට ලක්ව ඇත්දැයි විමසිය යුතු කරුණකි.

ඉවසීම නොමැති වීමෙන් පුද්ගලයාට ඇතිවන අයහපත් ප්‍රතිවිපාක පහක් බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ පඨම දුතිය අක්ඛන්ති සූත්‍රයේදී දක්වා ඇත. එනම්

බොහෝ දෙනාට අප්‍රිය වීම

බොහෝ දෙනා අතර අමනාපකම් ඇති අයකු වීම

රෞද්‍ර අයකු වීම

බොහෝ වෛරයක් තිබීම

සිහි මුළාවෙන් කළුරිය කිරීම

යන මෙකී අවස්ථාවන් නො ඉවසන පුද්ගල චරිත තුළින් දැකගත හැකි ය. ප්‍රකෝපකාරී මානසික ආතතීන්ගෙන් කටයුතු කරන මෙවන් අය අන් මතයට ඇහුම්කන් නොදෙන අතර, හිතුමතේට කටයුතු කිරීමට ද පෙළඹෙති. එසේ ඇතිවන අධික කෝපය හා ක්ෂණික කෝපය නිසා මනුෂ්‍ය ඝාතන, පොදු දේපළ විනාශ කිරීම, කලකෝලාහල, රථ වාහන අනතුරු, සියදිවි නසා ගැනීම්, ආදී සමාජ ගැටලු බොහොමයක් ඇතිවීමට හේතු වෙයි.



රත්නපුර පොත්ගුල් විහාරයීය
ශ්‍රී රතනපාල ධර්මායතන මූලික පිරිවෙනේ පරිවෙණාධිපති
රාජකීය පණ්ඩිත
**බෙංගමුවේ රක්ඛිත ධම්ම හිමි**

**"සිප් කිරි පෙවූ මූසිලයින් උඩුමාලේ අපෙ ගුරුතුමා යයි තාමත් ඉස්කෝලේ" සුනිල් එදිරිසිංහයන් ගයන මේ ගී පද කිහිපය තුළින් ම ගුරුවරයා යනු කවුරු ද යන්න ඉතා හොඳින් වටහා ගත හැකි ය. සමාජයේ සෑම තරාතිරමක කෙනෙක් ම නිර්මාණය කරනුයේ ගුරුවරයා විසිනි.**



# පොතපත කියවීමේ අගය සේ ම සමාජය කියවීමේ වටිනාකම ද දරුවන්ට කියා දෙන්න

අප අමතක නො කළ යුත්තේ එම ගුරුවරයාට ද ජීවිතයක් ඇති බව ය. සමාජ ජීවිතයේ දී බොහෝ වරප්‍රසාද හිමිවන්නේ ගුරුවරයාගේ අප්‍රතිහත ධෛර්ය තුළිනි. ඇතැම්විට එවැනි ගුරුවරු තවමත් තමන්ගේ මූලික අවශ්‍යතා ටික හෝ ඉටු කර ගැනීමට බැරුව එහෙත් ළද දෙයින් තෘප්තිමත් ව කටයුතු කරනු දක්නට ලැබේ. එහෙත් තමා ඉගැන්වූ දරුවන් සැප පහසුකම් ලබා සමාජයේ වැජඹෙනවා දැකීම බොහෝ සෙයින් ප්‍රිය කරති. මව්පියන්ටත් වඩා ඇතැම් විට දරුවාගේ දියුණුවේ දී ගුරුවරයා සතුටු වේ. ඇතැම් ළගම ඥතීන් ඊර්ෂ්‍යාවෙන් පෙළෙද්දී තම ශිෂ්‍යයන්ගේ හපන්කම් තුළ ගුරුවරයා ලබන සතුට ගැන ඇතමකුට අවබෝධයක් නැත. අප සියල්ලන්ට ම ගුරුවරයාගේ ඒ වෙහෙස, මග පෙන්වීම, සතුට පිළිබඳ යම් හෝ අවබෝධයක් ඇතුවාට සැක නැත. ගුත්තිල ගුරුවරයකු ලෙස, මූසිලට ගුරුමුෂ්ටි නොමැති ව ශිල්පය ලබා දුන්නේ ය. වර්තමාන ගුරුවරයා ද එසේ ම ය. ඒ අතර ගුරුවෘත්තිය ට නොගැලපෙන හැසිරීම් ඇති ඉතා සුළුතරයක් සමාජය තුළ නැතුවා ම නොවේ. එය ගුරුවරයාට පමණක් නොව සෑම ක්ෂේත්‍රයකට ම පොදු වූවකි.

වෛද්‍යවරයකුට වැරදුණහොත් ලෙඩා මරණයට පත් වේ. එහෙත් ගුරුවරයකුට වැරදීම වරද සමාජගත වීමට හේතුවකි. ඇතැම් ක්ෂේත්‍රවලට විකල්ප ඇතිමුත් ගුරුවරයාට විකල්ප ඇත්තේ නැත. එය අප සියල්ලෝ ම ඉතා හොඳින් තේරුම් ගත යුතු ය. ගුරුවරයාට වැරදීම හෝ ගුරුවරයාට වැරද්දවීම ඉතා පහසුවෙන් සිදු නොවන දෙයකි. අපේ සමාජවල "

"ගුරුන්ටත් අකුරු වරදී" යන පිරුළු පවා නිර්මාණය වී ඇත්තේ මේ නිසා වෙති. දිසාපාමොක්ට වැරදීම මත අහිංසක අංගුලිමාල විය. එහි දී තථාගතයන් වහන්සේ තුන් ලොවට ම ගුරුවරයා වූ බැවින් අංගුලිමාල සසර ම නිවැරැදිකරුවකු කළහ. තිලෝගුරු බුදුරදුන් හා සමාන ව පෘතග්ජන ගුරුවරයා දෙස නො බැලීමට ශිෂ්‍යයන් සහ මව්පියන් වගබලා ගත යුතු වේ. ඒ මන්දයත් එම ගුරුවරයාට ද සමාජයේ අනෙක් මිනිසුන්ට මුහුණ පාන්න වන සියලු ජීවන ගැටලු සමාන ය. දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දීමට නම් ගුරුවරයාගේ මානසිකත්වය නිරවුල්වීම ඉතා වැදගත් ය. එසේ නොමැති වුවහොත් මව්පියන් බලාපොරොත්තු වන ශික්ෂණය දරුවාගෙන් ගිලිහෙණු ඇත. දරුවකු බලා ගැනීමේ අමාරුකම වෙන කවර කලකටත් වඩා වර්තමානයේ දී මව්පියන්ට දැනෙමින් ඇත. මෙවන් පසුබිමක ප්‍රාථමික අංශයේ ගුරුවරියන් දරුවන් හතළිහක් පනහක් බලා ගැනීම කෙතරම් අසීරු ඇද්ද? එය බොහොම උපේක්ෂාවෙන් බැලිය යුතු ය.

ගුරුවරයා යනු පාසලක උගන්වන, උපකාරක පන්තියක ශිල්පය ලබා දෙන්නා පමණක් නොවේ. අපට ජීවිතයේ බොහෝ පාඩම් කියා දුන් සියල්ලෝ ම යම් විටෙක ගුරුවරු ය. ඕනෑම ක්ෂේත්‍රයක බොහෝ අත්දැකීම් සහිත අය ආධුනිකයන්ට එම ක්ෂේත්‍රය තුළ නිවැරැදි මග පෙන්වීමක් කරන්නේ නම්, තම අත්දැකීම් ඔවුන් සමඟ බෙදා ගන්නේ නම් ඔවුන් අපට හමු වූ ගුරුවරයන් සේ සැලකීම අවශ්‍යය. එපමණක් නොව හොඳින් හෝ නරකින් අපට බොහෝ පරිනතභාවයන් ලබාදුන් සියල්ලෝ ම ගුරුවරුන් සේ සැලකීම අවැඩක් නොවේ. මෙහි දී ජීවන අත්දැකීමක් දැක්වීම කාලෝචිත යැයි හැඟේ.

එක මවක් දානයක් ලබාදී තම දරුවන්ට ආශිර්වාද කොට මිය ගිය සැමියාට පින් අනුමෝදන් කළා ය. මෙය බලා සිටි ඒ මවගේ ලොකු පුතා අම්මාගෙන් ඇසුවේ "අම්මට, තාත්ත බොහෝ වධ හිංසා කළා. ඒ විතරක් නෙමෙයි, අප හැමෝට ම යුතුකම් කළේ නෑ. බීමත්කම නිසා ඔහු මිය ගියා. ඇයි අම්මේ ඒ තාත්තාට පින් දුන්නේ." යනුවෙනුයි. එහි දී මේ අම්මා ඉතා සිත් ගන්නා පිළිතුරක් ලබා දුන්නා.

"මම දුක ගැන බුදු දහමෙන් ඉගෙන ගෙන තිබුණා. ඒත් ඒ දුක මට අවබෝධ කරලා දුන්නේ ඔයාගේ තාත්තා. එහෙම බලනකොට ඔයාගේ තාත්තා මට ගුරුවරයෙක්. මම පින් දුන්නේ ඒ ගුරුවරයාටයි."

ගුරුවරයා යන්නට නව අරුතක් ලබා දෙන්නට මේ මව කටයුතු කිරීම ආස්වාදනීය යි.

තථාගතයන් වහන්සේට ද ගුරුවරයකු වූ හ. උන්වහන්සේ සත් සතිය තුළ දී ම ධර්මය ගුරු තනතුරේ තබා ගත්හ. එපමණක් නොව තමන්ගේ ඇවෑමෙන් ධර්මය ගුරු තනතුරෙහි තබා ගන්නා ලෙස ආනන්ද හිමියන්ට දේශනා කළහ. තිලමුට්ටි ජාතකයේ දී රජු අනාගතයෙහි සොරකු නොවීමට ගුරුවරයා දඬුවම් ලබා දුන්නේ ය. මුල් අවස්ථාවේ දී රජ කුමරුට නොවැටහුණ ගුරුවරයාගේ දඬුවම පසුව අවබෝධ විය. එපමණක් නොව සොරකම රජුට ඇවැඩ පිණිස හේතුවන බව පැවසුවේ ද ගුරුවරයා ය. එහෙයින් අපට හඳුනාගත හැක්කේ සෑම රජෙකුට ම ගුරුවරයකු වූ බවයි. ගුරු ඇසුර නො ලද ජීවිත බොහෝ හිස් ය. එමෙන් ම ගුරු ගෞරවය නැති හිත්වලට හෝ ඔවුනගේ දරුවනට ශිල්පය නොපිහිටයි. එය නොවෙනස් වූ සත්‍යයකි.

ගුරුවරයා යනු සමාජය වෙනස් කරන තීරණාත්මක සාධකය යි. අහිංසකලා, අංගුලිමාලලා කරනුයේ ද ගුරුවරයා විසිනි. ගුරු භූමිකාව තුළ පොතපතෙන් එහා සමාජය කියවන්නට හැකි දරුවන් නිර්මාණය කළ යුතු ය. එමෙන් ම නැණවතුන් කරන දරුවන් ගුණවතුන් කිරීම අවශ්‍යය. වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, උපාධිධාරීන් තනනුයේ ගුරුවරයා විසිනි. එහි දී බෙහෝ වංචා, මිනිස් ජීවිත විනාශ කරන සාහසික වෛද්‍යවරු බිහි නො කිරීමට වගබලා ගත යුතු ය. තම වෛද්‍ය දැනුම සමාජයේ ප්‍රගමනයට යොදා ගත හැකි වෛද්‍යවරු බිහි කළ යුතු ය. එසේ නොමැති වුවහොත් හිට්ලර්ගේ වද කඳවුරේ විෂ එන්නත් කොට මිනිසුන් ඝාතනය කළ වෛද්‍යවරු වැනි අය බිහිවිය හැකි ය. ඉංජිනේරුවරුන් ද එසේ ම ය. ඔවුනගේ දැනුම සමාජයේ දියුණුවට භාවිත කළ හැකි වීම අවශ්‍ය ය.ගුරුවරයා ඒ වෙනුවෙන් මැදිහත් විය යුතු ම ය. අධ්‍යාපනය යනු දැනුම කුසලතා සේ ම, ආකල්ප දියුණුවයි. ආකල්ප දියුණුව වෙනුවෙන් කාලච්ඡේදයක දී විනාඩි දහයක් හෝ වැය කිරීම ගුරුවරයා සතු කාර්යභාරයකි. මේ බව තේරුම් නො ගැනීම මත සමාජය නිසි මඟට ගැනීමට මහත් බාධාවකි.



කොළඹ මහානාම විද්‍යාලයේ ආචාර්ය
කොලොන්නාව පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**



> කෝපයක් ඇති වූ කල එය ඉක්මනින් හෝ ටික කලක් ගත වන විට හෝ නිවී යා හැකි ය. එසේ සිත වෙනස් නොවුණොත් එය වෛරයක් බවට හැරේ. වෛරය යනු සිතේ අල්ලා හිටින දෙයකි. බද්ධ වෛරය යනු භවයක් පාසා ගෙන යන වෛරය යි. මේ දෙකම ආරම්භ වන්නේ කෝපයෙනි.

# සසර පුරා දුක් දෙමින් පසුපස එන බද්ධ වෛරය

# නැති කර ගන්නේ මෙහෙම යි

ජීවිතය විනාශ කරන්නට තරම් හේතු වන සිතිවිලි අතර තරහව ප්‍රධානයි. තමන්ට විතරක් නොවෙයි, එය සමාජයීය වශයෙනුත් ඇති කරන්නේ අහිතකර බලපෑමක්. එම ආවේගකාරී හැඟීම් ඇති වූ වහාම පාලනය කර ගත යුතු වන්නේ ඒ නිසයි. තරහ සිතිවිලි පාලනය කර ගැනීමට සම්බුදු දහමෙහි එන ඉගැන්වීම් ඉතා සුවිශේෂී යි. වචනයට සීමා නොකොට ජීවිතයට ප්‍රායෝගික ව ගළපාගත හැකියි.

සිතිවිලි හඳුනාගැනීම

තරහව පාලනය කර ගන්නට නම්, පළමුව තමන්ගේ සිතිවිලි හඳුනාගත යුතුයි. මට මේ ඇවිත් තියෙන්නේ තරහක් ද? ද්වේෂ සිතක් ද? යන්න පළමුව දැන ගන්න. ඉන්පසු එහි ආදීනව, ඵල විපාක ගැන අවබෝධයක් ඇති කරගන්න. (සදෝස චිත්තංති පජානාති)

ඒ අනුව,

තරහ නැති කර ගැනීම සඳහා සිතේ කැමැත්තක් ඇති කරන්න ගන්න (ඡන්දං ජනේති)

ඒ සඳහා වෑයම් කරන්න (වායමති)

වීර්යය ආරම්භ කරන්න (විරියං ආරභති)

නෑ මං කේන්ති ගන්නෙ නෑ යනුවෙන් සිත තද කර ගන්න (චිත්තං පග්ගන්හාති)

කෝපය හෙවත් තරහව ආකාර දෙකකි. ඒ සාමාන්‍ය කෝපය සහ ක්ෂණික කෝපය යි. කෝපය පදනම් කරගෙන ඇති වන්නේ වෛරය යි. වෛරය ද ආකාර 2කි. සාමාන්‍ය වෛරය සහ බද්ධ වෛරය යනුවෙනි.

කෝපයක් ඇති වූ කල එය ඉක්මනින් හෝ ටික කලක් ගත වන විට හෝ නිවී යා හැකි ය. එසේ සිත වෙනස් නොවුණොත් එය වෛරයක් බවට හැරේ. වෛරය යනු සිතේ අල්ලා හිටින දෙයකි. බද්ධ වෛරය යනු භවයක් පාසා ගෙන යන වෛරය යි. මේ දෙකම ආරම්භ වන්නේ කෝපයෙනි.

තරහ දුරු කර ගන්නා ආකාරය පිළිබඳ ව අංගුත්තර නිකායේ එන ආඝාතපටිවිනය සූත්‍රය තුළ විස්තර කෙරේ. ආඝාතය යනු කෝපය යි. පටිවිනය යනු දුරු කිරීම යි. ඒ අනුව ආඝාතය හෙවත් තරහව පුද්ගලයා ඇති කර ගන්නා ආකාර පිළිබඳ ව පළමුව දක්වයි. එනම් යමෙක් මට අනර්ථයක්, අයහපතක් කළා යැයි කෝපය ඇතිකර ගනී. යමෙක් මට අනර්ථයක් කරනවා යැයි වර්තමානය පිළිබඳ කෝපය ඇතිකර ගනී. එසේම අනාගතයේ දී අනර්ථයක් කරන්නේ යැයි සිතා කෝපය ඇතිකර ගනී. මීට අමතර ව තමන්ගේ මිතුරාට සහෘදයාට අහිතක් කළේ යැයි ද තරහව ඇතිකර ගනී.

මේ අනුව කරුණු 4ක් පදනම් කරගෙන තමන් තුළ ගොඩ නැගුනු ද්වේෂය දුරු කර ගන්නා අන්දම ආකාර පහකින් මෙසේ දක්වයි.

ඒ තරහව ඔබ තුළ ඇති කළේ යම් පුද්ගලයකු නම් ඔහුට, ඇයට මෛත්‍රී කරන්න.

ඔහු, ඇය කෙරෙහි කරුණාව ඇති කර ගන්න.

ඒ පුද්ගලයා පිළිබඳ මැදහත් සිතින් සිතන්න. (නිදසුනක් ලෙස ඔබ පිළිබඳ ව වැරැදි දෙයක් ඔබේ හිතවතකු විසින් ඔබේ ප්‍රධානියාට පවසා ඇතැයි සිතමු. එවිට ඔබ තුළ තදබල කෝපයක් හට ගැනීම සාමාන්‍ය දෙයකි. එහෙත් මේ විදිහෙ යටිකූට්ටු වැඩ කිරීම, කේලාම් කීම මනුෂ්‍ය ස්වභාවයක්. ඒක ඒ මනුෂ්‍යයාගේ දුර්වල කමක්. ඒ නිසා මං ඒ ගැන කලබල වෙන්න ඕන නෑ යනුවෙන් මැදහත් සිතින් සිතීමට පුරුදු පුහුණු විය යුතු ය.)

යම් පුද්ගලයකු ඔබ තුළ තරහක් ඇති කළේ නම්, ඒ පුද්ගලයා සහ එම කාරණය පිළිබඳ මෙනෙහි කිරීමෙන් වැළකී හිඳින්න. බොහෝ විට අප කරන්නේ ඒ ගැන සිත සිතා හීල්ලීම, හිතවතුන්ට පවසමින් කෝපය තව තවත් වර්ධනය කර ගැනීම ආදිය යි. එහෙත් ඔබට ඒ පුද්ගලයා පිළිබඳ යළි යළිත් මෙනෙහි වන්නේ නම්, සහ ඒ හැම විටම කෝපය අලුත් වන්නේ නම් ඔබ කළ යුත්තේ ඒ පුද්ගලයාට මෛත්‍රී කිරීම යි. කරුණාවක් ඇති කර ගැනීම යි. උපේක්ෂාව ඇති කර ගැනීම යි.

එය ඒ පුද්ගලයාගේ කර්ම ස්වභාවය යැයි සිතා අනුකම්පා කිරීම යි.

මේ ආකාරයට කටයුතු කරන විට ඔබ තුළ තරහ හට ගැනීම, කෙන්තිය හටගැනීම වැළකී යයි.

අං.නි. සත්තක නිපාතයේ කොධන සූත්‍රයේ දක්වන පරිදි කේන්තිය, කෝපය නිසා ඇතිවන ආදීනව හතකි. "සත්තිමෙ භික්ඛවෙ, ධම්මා සපත්තකන්තා සපත්තකරණා කොධනං ආගච්ඡන්ති ඉත්ථිං වා පුරිසං වා. කතමෙ සත්ත.

ඉධ භික්ඛවෙ, සපත්තො සපත්තස්ස එවං ඉච්ඡති. අහො වතායං දුබ්බණ්ණො අස්සාති. තං කිස්ස හේතු. න භික්ඛවෙ, සපත්තො සපත්තස්ස වණ්ණවතාය නන්දති... (අං.නි. සත්තක නිපාත, දුතිය පණ්ණාසක, අබ්‍යාකතවග්ග, කොධන සුත්ත, (බු. ජ. මු.), 418). එනම්,

හොඳින් පිරිසුදුව සහ හොඳින් ඇඳ පැළඳ සිටිය ද පුද්ගලයා අප්‍රසන්න බවයි.

සිනිඳු සහ සැප පහසු සෝපාවක සයනය කළ ද පුද්ගලයා වේදනාවෙන් පෙළෙයි.

හොඳ සඳහා නරක සහ නරක සඳහා හොඳ වරද්දා ගනිමින් සැලකිල්ලෙන් සහ සිහිකල්පනාවෙන් කටයුතු නොකර හානිය සහ දුක්විඳීම ඇතිවන දේ කරයි.

මහන්සි වී උපයා ගත් ධනය නැති කර ගනී. නීතිය ඉදිරියේ වරදකරුවකු බවට පත්වීමට ද ඉඩ ඇත.


ක්‍රියාශූර ව ලබා ගත් කීර්තිය සහ යසස අහිමිකර ගැනේ.

නෑදෑයින් සහ පවුලේ උදවිය ඒ පුද්ගලයාමඟ හරිති, ඔහුගෙන් ඈත් වෙති.

අයහපත් ප්‍රතිඵල ගෙන දෙන කය, වචනය සහ සිත මඟින් අකුසල ක්‍රියා කෝප වූ පුද්ගලයා කරන හෙයින් මරණයෙන් මතු දුගතියක ඉපදෙයි.

යථෝක්ත කරුණු හත යම් පුද්ගලයකුගේ, සතුරන්ගේ සතුටට හේතු වන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. එබැවින් කෝප වූවකු සමඟ කෝප නොවිය යුතු බව ද වැඩිදුරටත් එම දේශනාවේ දී පැහැදිලි කරයි.

කෝපය, කේන්තිය පාලනය කර ගැනීම පිළිබඳ බුදුදහමේ ඉගැන්වීම් ලබන සතියේ දී තවදුරටත් විමසා බලමු.



පැල්මඩුල්ල ඓතිහාසික ශ්‍රී සුදර්ශන ධර්මශාලා පුරාණ විහාර භාරකාර,
අධ්‍යාපනවේදී
**ගලගම කුසලධම්ම හිමි**

# එකිනෙකාට පරිත්‍යාගශීලී වනවා නම් ඕනෑම දුකක් කරදරයක් ජය ගන්න පුළුවන්



**තාක්ෂණයෙන් පිරිපුන් ලොවක් නිර්මාණය කළ මිනිසා කොරෝනා අභියෝගය හමුවේ අද අසරණව සිටී. පණ නල රැක දෙන හුස්ම පොද ම මිනිසාට මරණීය තර්ජනාංගුලිය ඔසවාගෙන සිටී. මෙය කෙතරම් ඛේදජනක ඉරණමක් ද? මෙම ව්‍යසනකාරී අවස්ථාව පසුකිරීම ඇත්තෙන් ම අභියෝගාත්මක ගැටලුවකි. එසේ වුවත්, බුදුදහමින් අපට මෙම ගැටලුව විසඳා ගැනීම සඳහා ප්‍රවේශයක් විවර කර ගැනීමේ හැකියාව තිබේ. ඒ පිළිබඳ විමසා බැලීම මෙම ලිපියෙහි අරමුණ වේ.**

බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් හි පදනම වන්නේ ආචාරශීලී පැවැත්ම යි. එක් පුද්ගලයකුගේ ක්‍රියා කාරකම් තවත් පුද්ගලයකුගේ යහසාධනය කෙරෙහි බාධාකාරී නොවිය යුතු ය. සරල වචනයෙන් විස්තර කළ හොත් යම් පුද්ගලයෙක් තමන්ගේ හැසිරීම හේතුවෙන් තවත් අයකුට අවැඩක්, අනර්ථයක්, අයහපතක් නොකළ යුතු බවයි. බුද්ධ දේශනාවෙහි මෙම උපදේශය පනවා ඇත්තේ රාහුල සාමණේරයන් වෙනුවෙනි. පෘථග්ජන සිතිවිලිවලින් බැහැරවීම සඳහා රාහුල සාමණේරයන් හට ලබා දුන් උපදෙස් පෘතග්ජන අප හට ද එලෙසින් ම වලංගුවන අවස්ථා දැන් අප හමුවේ ඇත. එබැවින් බුදුදහම තවදුරටත් පිරික්සමින් පරාර්ථය මෙන් ම ස්වාර්ථය පිණිස ද දයා කරුණා ගුණාංග ඉස්මතුවන අයුරින් දෛනික ක්‍රියාකාරකම්වල අප නිරත විය යුත්තේ කෙසේද යන්න විමසා බලමු.

අංගුත්තර නිකායේ සත්තක වග්ගයෙහි සඳහන් 'සප්ත ආර්ය ධන' වර්තමාන සංදර්භය හා බෙහෙවින් ගැලපෙන ඉගැන්වීමක් බව පෙනී යයි. ගිහි සමාජයේ ස්ත්‍රියක හා පුරුෂයකු විසින් සද්ධා, සීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, ප්‍රඥ ලෙස සඳහන් වන ආර්ය ධන එදිනෙදා ජීවිතයෙහි ප්‍රගුණ කරන්නේ නම් ඕනෑම කෙනෙක් දිළිඳු බවට පත් නොවන බවයි, එමගින් අවධාරණය කරනුයේ. මෙම ධන සම්පත් අතරින් විචක්ෂණසීලී දැනුම (සුත) සහ දයා කරුණා පෙරදැරි පරිත්‍යාගය (චාග) කොරෝනා සමය තුළ භාවිත කළයුතු ආකාරය නිදසුන් කිහිපයක් ඔස්සේ විමසා බලමු.

'චාග' හෙවත් පරිත්‍යාගය විවිධාකාරයෙන් සමාජය තුළ ක්‍රියාවට නැංවේ. එය ආගමික පදනම මත භක්ති පූර්වක ව සිදු කෙරෙන 'දානය' යි. මජ්ඣිම නිකායේ දක්ඛිණාවිභංග සූත්‍රයෙහි දානයෙහි අනුසස් බොහෝ ආකාරයෙන් විස්තර කෙරේ. භික්ෂූන් වහන්සේ සඳහා වූ සිවුපසය සහිත සියලු පරිත්‍යාග දානය ට ඇතුළත් වේ.

කිතුණු, හින්දු, ඉස්ලාම් වැනි ආගම්වල ද පරිත්‍යාගය ඉමහත් භක්තියෙන් ඉටු කරන ආගමික ක්‍රියාවක් බව පැහැදිලි ය. බුදුදහම ගරු කරන මහායාන බෞද්ධ ප්‍රජාව, මරණින් මතු දිව්‍ය සම්පත් ලබා ගැනීමේ අරමුණින් 'පරිත්‍යාගය' කෙරෙහි සුවිශේෂී ඇල්මක් දක්වනු පෙනේ. සුඛාවතී දෙව්ලොව ඉපිද දිව්‍ය සැප විඳීමෙන් අනතුරුව මෛත්‍රී බුදුන් හමුවෙහි සසර ගමන නිම කිරීමේ අරමුණ කැපී පෙනෙන සංසිද්ධියකි. එම අරමුණ පෙරදැරි ව බුදුසසුනේ දියුණුව සඳහා සිදු කෙරෙන විශාල ධන පරිත්‍යාග ඉතා ආකර්ශණීය දාන කර්තව්‍යය ලෙසෙ පිළිගැනේ.

ථෙරවාදි බෞද්ධ සම්ප්‍රදාය තුළ 'දානය' සුවිශේෂී ආගමික ක්‍රියාවක් ලෙස පිළිගන්නා අතර සලාක දානයේ පටන් විවධ වූ සිවුරු පිරිකර සහිත දානය මෙන් ම ඇස්, ලේ, හා ශාරීරාංග දානය දක්වා එය පුලුල් වෙමින් පවතී. තවත් පුද්ගලයකුගේ නිරෝගී පැවැත්ම උදෙසා දෙන දානය ද 'පරිත්‍යාගයක්' වශයෙන් පිළිගැනීමට ලක් වී තිබේ. සමාජ යහපත උදෙසා පරිත්‍යාගශීලී වීමේ වැදගත්කම කොරෝනා වසංගත සමය අපට සිහිගන්වන ඉගැන්වීමක් බැවින්, 'චාග ධනය හෙවත් පරිත්‍යාගශීලීබව පිළිබඳ ත්‍රිපිටක ඉගැන්වීම් ඔස්සේ නිදසුන් කිහිපයක් සලකා බලමු.

දීඝ නිකායේ සෝණදණ්ඩ සූත්‍රයෙහි සෝණදණ්ඩ බමුණු ගුරුතුමා බුදුන්වහන්සේ පිළිබඳ ව සිය ගෝල පිරිසට හඳුන්වා දුන් ආකාරය ඉතා රමණීය ය. එම සූත්‍රයට අනුව බුදුන්වහන්සේගේ චරිතය හඳුනාගත්තේ එකල බ්‍රාහ්මණ සමාජයේ පිළිගැනීමට ලක් වූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වෙනුවට සෝණදණ්ඩ පඬිවරයා අගය කරන්නේ බුදුන් වහන්සේගේ මෘදු මොලොක් ගුණයයි.

ශ්‍රවණයට ප්‍රිය වූ වචන කතා කරන – සඛිලෝ

පිළිසඳර කතාවට උත්සුක වන – සම්මෝදකෝ

ඇහිබැම හකුළවමින් අකමැත්ත ප්‍රකට නොකරන – අබ්භාකුටිකෝ

හමුවීමට පැමිණෙන්නා කතාවට උනන්දු කරවන – උත්තානමුඛෝ

සැපදුක් විමසමින් ප්‍රථමයෙන් ම ආමන්ත්‍රණය කරන – පුබ්බභාසී

මෙයින් ප්‍රකට වන්නේ බුදුන් වහන්සේගේ ත්‍යාගශීලී ගුණය නොවේද?

බොදුනුවන් වන අපි බුදුන් වහන්සේට දිනපතා වන්දනා කරමු. එහෙත් බුද්ධ චරිතයෙන් උකහා ගත යුතු 'ත්‍යාගශීලීබව' වැනි උදාර ගුණාංග පිළිබඳ ඉගැන්වීම් ළමා කාලයේ සිට හඳුන්වා දීමට නිසි අවධානයක් යොමු වී ඇති බවක් නොපෙනේ.

පරිත්‍යාගය, එසේත් නැතිනම්, 'චාග ධනය' අප එකිනෙකාගේ පෞද්ගලික ජීවිතයට මෙන් ම, පවුල් ජීවිතයටත් ඉන් ඔබ්බෙහි වූ සමාජ යහපැවැත්මටත් උපකාර වන ආකාරය පිළිබඳ බුද්ධ චරිතය විමසීම මගින් පැහැදිලි කර ගැනීමට හැකි වේ. සමාජයේ ඉතා පහත් කුලයකින් පැමිණී අයකුට වුව ද බුදුන්වහන්සේ දැක්වූ සම මෙත බුද්ධ චරිතය තුළින් මතුකර ගත යුතු හෘදයාංගම චාගී ගුණය ලෙස සමාජයට හඳුන්වාදීම කොතරම් කාලෝචිත ද?

දෙවැනි නිදසුන වන්නේ අංගුත්තර නිකායේ තික නිපාතයේ සඳහන් උපෝසථ සූත්‍රයේ විසාකා උපාසිකා චරිතය තුළින් ත්‍යාගශීලී බව විමසා බැලීමයි. බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්න කෙරෙහි පැහැදුණු විසාකාව ළමා වියේදී මමත්වය, විචිකිච්චාව සහ සීලව්‍රත සමාදානය ඉවත ලූ අතර, දහසය හැවිරිදි වියෙහි දී සිය මාමණ්ඩිය බුදුන් කෙරෙහි පැහැදවීමට ඥානාන්විත ව මඟ හෙළිපෙහෙළිකර දීමට සමත් වූවා ය. එපමණක් නොව විශාකාව ප්‍රසූත වේදනාවෙන් පීඩිත වූ වෙළඹකට මැදියම් රාත්‍රිය පුරා උණුසුම් තෙල් සාත්තුවකින් සම්බාහනය කරමින් ප්‍රසූතියට උපකාර කළ බව කියැවෙන පුවත වර්තමාන දරුවන්ගේ සංවේදී චෛතසික මතුකිරීමට සමත් වන අවස්ථාවක් බව නිසැක ය. සිය පරපුර විසින් ප්‍රකට කළ මමත්වය හා මානය යටපත් එමෙන් ම, සෝවාන් දක්වා දියුණු කරන ලද චෛතසික ස්වභාවයෙන් යුත් ඇය කුලගෙට පැමිණි විට ඔවුන්හට ලැබුණු තෑගි බෝග නෑදෑයින් සහ අසල්වාසී හිතමිතුරන්හට ප්‍රදානය කිරීමට ක්‍රියා කළා ය. නෑ සබඳකම් තරකර ගැනීම මෙන් ම අසල්වාසීන් සමග හිතමිතුරු බව වැඩිදියුණු කර ගැනීම සඳහා ඇය විසින් අනුගමනය කරන ලද මෙම ත්‍යාගී ගුණය වත්මන් තරුණ පරපුරට ද ඉමහත් ආදර්ශයක් ලබා දෙයි.

තෙවැනි ව, වැඩිහිටි විවාහක යුවලක් විසින් අනුගමනය කළ යුතු සහනශීලී දිවි පෙවෙතකට නිදසුන් වශයෙන් සංයුක්ත නිකායේ නකුල පිතු සූත්‍රයේ මෙසේ සඳහන් වෙයි. අසූ වියට පැමිණි නකුල මාතා පිතු යුවල මතු භවයන් හි ද ස්වාමි – භාර්යා වශයෙන් ජීවත්වීම පිළිබඳ ප්‍රාර්ථනාව ඉටුවන්නේ ද යන්න බුදුන් වහන්සේගෙන් විමසූ අතර, එයට පිළිතුර වූයේ අන්‍යොන්‍ය අවබෝධය මත ක්‍රියා කිරීමෙන් එම පැතුම ඉටුවන බවයි. ඒ සඳහා අනෙකාගේ සිතැඟි හඳුනාගෙන දෛනික ජීවිත පිළිවෙත සකස් කර ගැනීම සඳහා සමසද්ධා, සමසීල, සමචාග, සම ප්‍රඥ යන මානසික ගුණාංග වැඩිදියුණු කිරීමයි. එමගින් පවුල් ජීවිත ආශ්‍රිත ව සිදුවන හැලහැප්පිලි සමනය කිරීමට හැකියාව ලැබේ. එමෙන් ම, නකුල පිතා ඇඩ් ලෙස ගිලන් වූ මොහොතේ නකුල මාතාවගේ ප්‍රියශීලී අගයුම් සහිත වදන් ශ්‍රවණය කිරීමෙන් නිරෝගී බව ලැබූ පුවත වත්මන් විවාහක යුවළ විසින් කුතුහලයෙන් යුතුව විමසිය යුතු කරුණක් බව සඳහන් කළ යුතු ය.

මේ කරුණු අනුව නව යෞවනයන්හට මෙන්ම තරුණ ස්වාමි – භාර්යාවන් හට උපදෙස් හා මඟ පෙන්වීම සඳහා ත්‍රිපිටකයේ සඳහන් සූත්‍ර දේශනා පිළිබඳ නව කියවීමක් අත්‍යවශ්‍ය වන බව පෙනී යයි. බටහිර ලෝකයේ උගතුන් විසින් මනෝ කායික රෝග නිවාරණය සඳහා සිත පිළිබඳ ව ගවේෂණය කරමින් ආනාපාන සති වැඩීම වැනි ක්‍රමවේදයන් නිර්දේශ කිරීම සිදු කරන සමයක, බුද්ධ දේශනාවේ සඳහන් ආධ්‍යාත්මික ගුණාංග සමාජගත කිරීමට අප තවමත් ප්‍රමාද වන්නේ මන්ද යන්න විමතියට කරුණකි.

යහපත් සමාජයක් සඳහා බාල පරපුර හැඩගැස්වීම අත්‍යවශ්‍ය මූලික සාධකයකි. ඒ සඳහා යුතුකම් – වගකීම් හඳුනාගෙන ඒවා ප්‍රායෝගික ව ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍යය. බුදුන් වහන්සේගේ මඟ පෙන්වීම අතුළත් සිඟාලෝවාද සූත්‍රය පමණක් වුව ද ඒ සඳහා ප්‍රමාණවත් ය.

බුද්ධ චරිතයේ සැඟවුණු අරුත් නැවත මතුකරමින් බුදුන් වහන්සේ විසින් ගිහි සමාජය වෙත හෙළන ලද කරුණාබර බැල්ම සහිත පරිත්‍යාගී ගුණය ඉස්මතු කොට, එම ගුණ ජීවිතයට ප්‍රායෝගික කොට කොරෝනාව ජයගැනීම උදෙසා සමාජය දිරිගැන්විය යුතු කාලය එළඹ ඇති බව පෙනේ.



අධ්‍යාපනවේදී රාජකීය පණ්ඩිත
**රත්තින්දේ සෝමානන්ද හිමි**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## වප් පුර අටවක 2021-10-13

## ජීවිතයට වටිනාකමක්

කොරෝනා වසංගතයත් සමඟ දීර්ඝ කාලයක් පුරා උඩු යටිකුරු වෙමින් පැවති ජීවිත දැන් ටිකෙන් ටික සාමාන්‍ය අතට හැරෙමින් තිබේ. ඉදිරියේ දී එම තත්වය හොඳ අතට හරවා ගන්නවා ද, නරක අතට හරවා ගන්නවා ද යන්නෙහි තීරණය ඇත්තේ ද අප අතේ ම ය. ඒ ලෝකයක් අඩපණ කළ මේ භයානක වෛරසය තවමත් සක්‍රිය තත්ත්වයේ පවතින බැවිනි. එයට එරෙහි වන්නට නම් විශේෂයෙන් අපගේ ඇවතුම් පැවතුම්වල විනය පවත්වා ගැනීම අත්‍යවශ්‍ය ය. අවවාද, උපදෙස් පිළිපැදීම බුදු දහමේ ඉහළින් ම අගය කෙරෙන්නකි.


පසුගිය කාලය පුරාම සෞඛ්‍යය ඇතුළු අදාළ විවිධ අංශ මඟින් ජනතාව නිරන්තරයෙන් දැනුම්වත් කළේ, උපදෙස් ලබා දුන්නේ නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කොට රෝගයෙන් වැළකී සිටීමට ය. සුළුතරයකගේ අකීකරු වීම් නිසා බොහෝ දෙනකුට රෝගය ආසාධිත වී දැඩි කායික මානසික පීඩා විඳින්නට සිදු වූ අතර ම, වටිනා ජීවිත ද බොහෝ ප්‍රමාණයක් අහිමි විය. මරණයේ වේදනාව මිය ගිය අයට නොව, ජීවත්වන්නන්ට ය යන ජනවහරේ එන කියමනට අනුව කොරෝනා උවදුර නිසා අකාලයේ මව්පියන් අහිමි වූ දරුවන්ට, දරුවන් අහිමි වූ මව්පියන්ට ආදී ලෙස ඉතිරි වී ඇත්තේ වේදනාව පමණි. ඉදිරියේ හෝ එම කනගාටුදායක සිදුවීම්වල හවුල්කරුවන් නොවීමේ වගකීම අප සතු ය.

ලෙඩරෝගවලට පහසුවෙන් ගොදුරු වන්නේ සිරුරේ ප්‍රතිශක්තිකරණය අඩු වීම නිසා ය. ප්‍රතිශක්තිය දුර්වල වීමට අපගේ ආහාර රටාව සුවිශේෂී බලපෑමක් ඇති කරන බව කුඩා දරුවකු වුව දන්නා කාරණයකි. එහෙත් පසුගිය කාලය පුරා අපේ ජනතාව වැඩි ප්‍රමාණයක් ආහාරයට ගනු ලැබුවේ ක්ෂණික ආහාර ය. තෙල්, පිටි අධික ආහාරවලින් ශරීරයට ලැබෙන ප්‍රතිශක්තිය ගැන ඇත්තේ කිනම් සහතිකයක් ද? ක්ෂණික ආහාරවලට ජනතාව මොන තරම් ඇබ්බැහි වී සිටිනවා ද කියනවා නම් අද ග්‍රාමීය ප්‍රදේශවල පවා ජන වහරේ ම එන ලෙස චූන්පාන් රථ වැහි වැහැලා ය. උදේට සවසට මේවායෙහි පුරවාගෙන යන ක්ෂණික ආහාර විකිණෙන වේගය අපට කියන්නේ අපේ ගෘහණියගේ අලසකම යි.

සෑම ගෘහණියක් ම පාහේ දරුවන් සිටින මවකි. ඒ අනුව අපේ දරුවන්ගේ කුස වැඩි වශයෙන් පිරෙන්නේ එම ආහාරවලිනි. දරුවන්ට යමක් රත් කර දෙන්නට ඇති අලසකම තුළ ඔවුන්ගේ අනාගතය ආගාධයේ ය. සුළු රෝගී තත්වයකටවත් මුහුණ දෙන්නට තරම් ප්‍රතිශක්තියක් නොමැති වීම නිසා ය. එහෙයින් මොන තරම් කාර්ය බහුල වුව ද අපගේ ආහාර රටාව ගැන නැවත සිතන්නට කාලය පැමිණ තිබේ.

බුදුරජාණන් වහන්සේ අපට මැදුම් පිළිවෙතක් ගැන දේශනා කොට වදාළහ. ලෝකෝත්තර සුවයට සේ ම ලෞකික ජීවිතය නිසි ලෙස හසුරුවා ගන්නට එමඟින් හැකියාව ලැබේ. අසීමිත සුඛ විහරණය වෙනුවට අපට සරල ජීවන රටාවට හුරු වන්නට සිදු වේ. පසුගිය කාලයේ බොහෝ දෙනකුට ආර්ථික ම ය අසීරුතාවන්ට මුහුණ දෙන්නට සිදු විය. සරල ජීවිතයකට හුරු වුණා නම් ජීවත් වීම පහසු ය.

ආගමානුකූල ජීවිතය බොහෝ ගැටලුවලට විසඳුම් ලබා දෙන්නේ ය. මෙලොව ජීවිතය සේ ම පරලොව ද සුවපත් කරන්නේ ය . ආගම නමට සීමා නොකොට ජීවිතයට පුරුදු කළ යුතු ය. ජීවිතයට වටිනාකමක් ලැබෙන්නේ එවිට ය.



# The Buddha Leaves the Quarrelling Monks and Retires to the Parileyya Forest for the Rainy Season Retreat

Kosambi is one of the main and famous holy cities in Shravatthi, India. On one occasion the Buddha stayed in the city of Kosambi with his disciples to observe the Vas (the rainy season retreat).

During that time unfortunately arose a little incident among the monks regarding the Vinaya and Dhamma. As time passed it gradually increased and led to dissension among the monks of Kosambi and they themselves divided into two groups and followed the Vinaya and Dhamma separately in two ways according to their views and opinions. with some principles. Due to holding and following these fruitless (barren) views and opinions they often created unwholesome thoughts in their minds against each other and eventually it developed into a big quarrel among them. The Buddha had been informed about this by some senior monks and he advised the quarrelling monks to stop the useless quarrelling and arguing on Vinaya and Dhamma. These two groups of monks did not listen to the Buddha's advice and they continuously pursued the wrong thoughts, quarrelling with each other. But the Buddha knew that one day they would finally understand and realize the barrenness of quarrelling and arguing on the created controversy. So the Buddha gave them time to compromise and he decided to leave the vicinity of the quarrelling monks for a few months until they wisely see and realize the fruitless dispute. The Buddha took only his bowl and robes and without telling anyone he moved on to the great forest, Parileyya all alone for spending the rainy season retreat for three months.

The elephant, Parileyya saw the Buddha entered the forest and it was overjoyed by seeing the physical body of the fully Enlightened One. For a while, Parileyya observed the Buddha's behaviour, calmness and serenity and approached him boldly paying its great respect and homage as it welcomed the Buddha obediently with enormous reverence. Noticing this elephant's behaviour and good qualities, the Buddha instantly realized that this elephant was not an ordinary one and it was a Bodhisatta elephant. Forming a mutual understanding, both the Buddha and the elephant Parilieyya spent their lives together with much affection, in the forest. Though the elephant was a beast it provided a comfortable forest abode to the Buddha to spend his time in peace in the middle of the forest. Also, Parileyya protected the Buddha while he was spending time in meditation in and out of the Parileyya cave from each and every disaster in the forest. It dearly and confidently offered alms to the Buddha every day on time with great devotion. In the meantime, a monkey of the forest seeing Parileyya's offering of food and fruits to the Buddha also offered a honeycomb in faith to the Enlightened One and was over rejoiced by himself.

Eventually, after the death of these beasts, they were instantly reborn in divine realms with a lot of luxuries due to accumulating merits by providing comfortable facilities and offering alms to the Buddha during his retirement in the forest.

**Dr. Ven. DodamgodaSumanasaraThero**
University of Sri Jayewardenepura
Faculty of Humanities and Social Sciences

# සදහම් ආලෝකයෙන් ලක්දිව එළිය කළ සිහි කර වඳිමු අනුබුදු හිමි ගුණ පතළ



" මිහිඳු මහරහතන් වහන්සේගේ පිරිනිවීම ගැන ඇසූ උත්තිය රජු මහත් වේදනාවට පත් විය. වහා සෑගිරියට ගියේ ය. නිසල ශ්‍රී දේහයට වන්දනා කොට මිහිඳු මා හිමියන්ගේ උතුම් ගුණ කඳ පවසමින් මහත් ශෝක විය. "

**තථාගතයන් වහන්සේ දේශනා කොට වදාළ උතුම් ශ්‍රී සද්ධර්මය අප මාතෘ භූමියට දායාද කොට වදාළේ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ය.**

ගෞතම බුදු සසුනේ වැඩ සිටි මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ තෙවන ධර්ම සංගායනාවෙන් පසු මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල නම් රහතන් වහන්සේට දන්වා සිටියේ

ඔබ වහන්සේ ලංකා දීපයට වැඩම කොට ගෞතම සම්මා සම්බුද්ධ ශාසනය එහි පිහිටුවන ලෙසට ය. ඒ අනුව සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236ක් ගත වූ පොසොන් පුන් පෝදින ලක්වැසි අපට අමා දහම් වැසි වස්වනු පිණිස අනුබුදු මිහිඳු මාහිමියන් වහන්සේ මිහින්තලාවට වැඩම කළ සේක.

## ධර්ම දූත මෙහෙවර...

මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කොට මුල් වසරෙහි මහමෙව්නා උයනෙහි දෙවන පැතිස් රජු ලවා මහාවිහාරය කරවූහ. දෙවනුව මිහින්තලේ සෑගිරිය ද, තෙවනුව ථූපාරාම සෑරදුන් වහන්සේ ද කරවූහ. සිව්වනුව ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ වැඩම වූ අතර, පස්වෙනුව රුවන්මැලි මහා සෑ රදුන් වහන්සේ ඉදිවන ස්ථානයේ ගල්ටැඹ පිහිටුවූ සේක. සයවනුව ඉසුරුමුණි විහාරය මෙන් ම පඨමක චේතියත්, වෙස්සගිරි විහාරයත් කරවීමට අනුශාසනා කළේ මිහිඳු මා හිමියන් ම ය. එදා පටන් ගමයි, පන්සලයි, වැවයි දාගැබයි යන ශ්‍රේෂ්ඨ සංස්කෘතිය අපට උරුම විය.

මිහිඳු මා හිමියන් පිරිනිවන් පා වදාළ අවස්ථාවේ අප රට පාලනය කරනු ලැබුවේ දෙවනපෑතිස් රජුගේ සොහොයුරු වූ උත්තිය රජු විසිනි. මිහිඳු මා හිමියන් ලක්දිවට වඩින විට තිස් දෙවැනි වියේ පසු වූ සේක. උන්වහන්සේ අවුරුදු අසූවක් ආයු වැළඳූ සේක. උපසම්පදාවෙන් සැටවස් පිරී තිබුණි. ඒ කාලයේ උන්වහන්සේ වැඩ සිටියේ මිහින්තලේ සෑගිරි වෙහෙරේ ය.

## හෙළදිව එළිය කළ හිරු මඬල බැස යයි...

සියලු ධර්මයන්හි අනිත්‍ය බව පසක් කරමින් අපගේ කල්‍යාණ මිත්‍ර වූ, ආධ්‍යාත්මික ගුරුවරයාණන් වහන්සේ වූ මිහිඳු මහ රහතන් වහන්සේ පිරිනිවන් පා වදාළ සේක. එදින වප් මාසයේ පුර පක්ෂයේ අටවක දවස යි. එනිසා එම දිනය එකල හෙළ බොදුනුවන් හැඳින්වූයේ "ශ්‍රී මිහිඳු පුර අටවක" නිමිති. එනම් බුද්ධ වර්ෂ 284 දී ය. මිහිඳු මහරහතන් වහන්සේගේ පිරිනිවීම ගැන ඇසූ උත්තිය රජු මහත් වේදනාවට පත් විය. වහා සෑගිරියට ගියේ ය. නිසල ශ්‍රී දේහයට වන්දනා කොට මිහිඳු මා හිමියන්ගේ උතුම් ගුණ කඳ පවසමින් මහත් ශෝක විය. රන් දෙණක සුවඳ තෙල් පුරවා ශ්‍රී දේහය එහි තැන්පත් කොට රන් කුළුගෙයක තබා මහත් ගෞරවයෙන් අනුරාධපුරයට වඩමවන ලද්දේ ය. ධජ පතාක ඔසවා, තොරන් බඳවා

මල් මාලාවන්ගෙන් සරසා, පුන්කලස් තබ්බවා නගරය අලංකාර කරන ලද්දේ ය. මා හිමියන්ට කෘත ගුණ දැක්වීමට බොහෝ බොදුනුවෝ දිවයිනේ නන් දෙසින් ඇදී ආහ. ශ්‍රී දේහය කූටාගාරයක තැන්පත් කරවා සත් දිනක් පුරා අපමණ පූජෝපහාර පවත්වන ලද්දේ ය. දෙවිවරු අහස් ගැබෙන් උපහාර පිණිස මල්වරුසා වැස්ස වූහ. උන්වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කළ භූමියට ගෞරව පිණිස ඉසිභූමංගන යන නාමය තබන ලදී. උත්තිය රජු විසින් එහි අරහන්තක ධාතු තැන්පත් කොට චෛත්‍යයක් ද කරවන ලදී.

## මිහිඳු මා හිමි කෘතගුණ පූජා...

මිහිඳු මාහිමියන්ගේ පිරිනිවන් පෑමෙන් වසර 560 කට පසු රජ වූ මේඝවර්ණ රජු මිහිඳු මාහිමි ගුණ සමරා මිහිඳු පුර අටවක දින මහ පින්කම් සිදුකොට ඇත. එලෙසෙ ම පසු කලෙක රජ වූ සිරිමෙවන් රජතුමා ද මිහිඳු මා හිමි සමරා මහත් වූ පුද පූජා කළ බව මහාවංශයේ සඳහන් ය.

එහි සඳහන් පරිදි රජු විසින් මිහිඳු මා හිමියන්ගේ සිරුරෙහි පමණට ම තනි රත්තරනින් පිළිම වහන්සේ නමක් කරවා වප් මස පුර අටවකට පෙරදින මිහින්තලයට වැඩමවා අම්බස්ථලයෙහි අටවක දින වැඩ සිටීමට සැලැස්වී ය. පසුදින ලංකාදීපයේ සියලු භික්ෂූන් වහන්සේ ද, සිවුරඟ සේනාවන් ද, නගරවාසීන් ද කැටුව අපට අනුබුදු රුවන බඳු, ලංකාදීපයට ශාස්තෘ බඳු වූ, මිහිඳු මහරහතන් වහන්සේට වන්දනා කිරීමට ගියහ. එමෙන් ම නගරයේ සිර ගෙවල්වල සිටි සිරකරුවන් ද නිදහස් කොට මහා දන්සැල් පිහිටුවා සියලු ප්‍රධානීන්ට වැටුප් දී මිහිඳු මහ රහතන් වහන්සේ උදෙසා සියලු උපහාරයන්ගෙන් යුත් අපමණ පූජා පවත්වා ඇත.

අම්බස්ථලයෙහි පටන් අනුරාධපුර දක්වා මාර්ගය ඉතා පියකරුව ව සරසා මිහිඳු මහ රහතන් වහන්සේගේ පිළිම වහන්සේ වැඩමවන දා භික්ෂු භික්ෂුණී උභය සංඝයා උදෙසා සිවුපසයෙන් සංග්‍රහ කර, දුගී මගී යාචකයන්ට මහ දන් දුන්හ. ජනතාවෙනි අපගේ "මිහිඳු මහ රහතන් වහන්සේ අනුරාධපුරයට වැඩම කරනා අයුරු මෙසේ බලව" කියමින් සිරිමෙවන් රජතුමා මහත් වූ හරසරින් පිළිම වහන්සේ වැඩමවාගෙන විත් නගරයේ නැඟෙනහිර දෙරටුව අසල කරවන ලද විහාරයෙහි තුන් දිනක් වඩා හිඳුවාවීය. එම මන්දිරයේ ම ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල, සුමන හා භණ්ඩුක යන රහතන් වහන්සේලාගේ ද පිළිම වහන්සේලා කරවා එහි වඩා හිඳවූහ. වාර්ෂික ව මෙවැනි උපහාර පූජෝත්සව පවත්වන්නට රාජ නියෝග ද කළේ ය.

එමෙන් ම මහ මිහිඳු හිමි පිළිම වහන්සේ මහා විහාරයට වැඩමවා වාර්ෂිකව වප් මස දහතුන් වැනි දා පුද පූජාවන් පවත්වන්නට විධි විධාන යෙදී ය. සිරිමෙවන් රජුගේ පරම්පරාවෙන් පැමිණි ලක්දිව රජවරුන් එම මිහිඳු පුර අටවක උපහාර පූජාව නො කඩවා වසර තුන්සියයක් පවත්වා ඇත. මෙවර මිහිඳු පුර අටවක දිනය යෙදෙන්නේ ඔක්තෝබර් මස 13 වන දිනට ය.

ලක්වැසි අපි සියලු දෙනා අපට ශාසන දායාදය ලබා දුන් ඒ උත්තම මිහිඳු මහ රහතන් වහන්සේගේ ගුණ සමුදාය සිහි කරමු. උන්වහන්සේ පෙන්වා වදාළ සදහම් මඟෙහි ගමන් කරන්නට වඩාත් උත්සාහවත් වෙමු.

නයනා නිල්මිණී

# රහතන් වහන්සේට ඍද්ධිමය හැකියාව තිබිය යුතු ම ද?



“සිතුල්පව්ව මහ වෙහෙරෙහි වැඩ සිටි මහ රහතන් වහන්සේ නමකගේ උපස්ථායක භික්ෂුව ලෙස කටයුතු කරන ලද්දේ මහලු කල පැවිදි වූ භික්ෂුවකි. එක් දිනක් මේ භික්ෂුව මහ රහතන් වහන්සේගේ පා සිවුරු රැගෙන උන්වහන්සේ පසුපසින් යන ගමන් “ස්වාමිනි, ආර්යයන් වහන්සේ කියන්නේ මොන විදියේ ඇත්තන්ට දැ?”යි විමසයි. එකල්හි මහ රහතන් වහන්සේ “ඇවැත්නි, ආර්යයන් හඳුනා ගැනීම දුෂ්කර කාර්යයකි. ඇතැම් මහලු අය ආර්යයන්ට ඇප උපස්ථාන කරමින්, උන්වහන්සේගේ පා සිවුරු රැගෙන උන්වහන්සේලා සමඟ එහා මෙහා යමින් ආර්යන් වහන්සේ නො දනිති” යි ප්‍රකාශ කරයි.”

**ලෝභ, ද්වේෂ, මෝහ අකුසල මූලයන් බිඳ දැමූ, අලෝභ, අද්වේෂ, අමෝහ කුසල මූලයන් වැඩූ, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය අවබෝධ කළ, පටිච්චසමුප්පාදය සහ චතුරාර්ය සත්‍ය අවබෝධ කළ උත්තමයන් රහත් යන පදයෙන් අර්ථවත් වෙයි. රහත් තත්ත්වයට පත් වූ පසු සිදු කරන සියලු කුසල් විපාක දීමක් නොවන අතර, එය ක්‍රියාවක් පමණක් බවට පත් වෙයි. මෙයට හේතු වන්නේ නැවත උපතක් නොමැති නිසා එම කුසලවල විපාක අත්විඳීමට නො ලැබීම යි.**

*නැවත උපතක් නැති, භෞතික හෝ අභෞතික තෘෂ්ණාවක් නොමැති උත්තමයන්ගේ ලක්ෂණ කෙබඳු දැයි සොයා බැලීම වැදගත් ය. රහතන් වහන්සේ නමක් නම් ඍද්ධිය හිමි වූ තැනැත්තකු විය යුතු බව ලක්දිව බෞද්ධ ජනයාගේ දැඩි විශ්වාසය යි. එහෙත් පෙළ දහමෙහි සහ අටුවා කථාවස්තුවල දැක්වෙන පුවත්වලින් පැහැදිලි වන්නේ රහත් භාවය ලැබූ සියලු දෙනාට ම ඍද්ධිමය හැකියාව නො ලැබෙන බවයි. මෙය මෙසේ නම් කවර ලක්ෂණවලින් රහතන් වහන්සේලා හඳුනාගත හැකි වේ ද? යන්න විමසා බැලිය යුතු ය. බුදුන් වහන්සේ විසින් ධම්මපද දේශනාවේ දී රහතන් වහන්සේලාගේ ලක්ෂණ සමූහයක් පෙන්වා දී ඇත. එයින් රහතන් වහන්සේ නමකගේ ලක්ෂණ කෙබඳු ද යන්න පෙනෙයි. එහි දී රහතන් වහන්සේ ශෝක නොවීම, කෙලෙස් දැවිල්ලක් නොමැතිවීම, මනා සිහි නුවණින් යුතු වීම, ලබා ගත් ධ්‍යානාදියෙහි නැවත නැවත යෙදීම, වාසස්ථානවල නො ඇලීම, ගොදුරු ගෙන විල් අතහැර යන හංසයන් මෙන් ඔවුන් හැම තැනක් ම අපේක්ෂා රහිත ව හැර දමා යාම, රාග ද්වේෂ මෝහ නොමැතිවීම, කර්ම රැස් කිරීමක් නොමැතිවීම, සිවුපසය රැස් කිරීමක් නොමැතිවීම, තම ආහාරයෙහි පමණ දැනීම, අහසෙහි පක්ෂීන් ගිය මඟ හඳුනා ගත නො හැක්කාක් මෙන් රහතුන් ගිය මාර්ගයෙහි සලකුණු හඳුනා ගැනීමට නො හැකිවීම, කාමාදි ආශ්‍රව සියල්ල දුරු කර සිටීම, ආහාරයෙහි නොඇලීම, මානයක් නොමැතිවීම, පංචේන්ද්‍රියන් මනා ව සංසිඳුවා සිටීම, චපල ගති නොමැතිවීම, අට ලෝදහමෙහි කම්පා නොවීම, ධුතාංග ආදි ව්‍රත දැරීම, මඩ නැති විලක් මෙන් පිරිසුදු පැවැතුම් ඇතිවීම, සුගති දුගති දෙකෙහි හැසිරීම් නැතිවීම, චතුරාර්ය සත්‍ය මනාව දැන සිටීම, සිත කය වචනය යන තුන් දෙර ශාන්ත බවින් යුතුවීම, බුදුරජාණන් වහන්සේ හැර අන්‍ය ශාස්තෘන් කෙරෙහි ඇදහිලි නොමැතිවීම, බුද්ධ දේශනාව හැර වෙනත් දේශනා ප්‍රකාශ නො කිරීම, තෘෂ්ණාව පහ කර සිටීම, රහතුන් වැඩ සිටින ස්ථාන සිත්කලුවීම යන ලක්ෂණ රහතන් වහන්සේ නමක වෙතින් ප්‍රදර්ශනය වන බව පෙන්වා දී ඇත. මෙම ලක්ෂණ බුදුන් වහන්සේ විසින් දේශනා කොට වදාළත් බොහෝ රහතන් වහන්සේපෘථග්ජන භික්ෂූන්ගෙන් වෙන් කර හඳුනා ගැනිම අපහසු ය. ඒ බව මජ්ඣිම නිකාය අටුවාවේ කථාවස්තුවල දැක්වෙන කථා පුවතකින් තහවුරු වෙයි.*

*සිතුල්පව්ව මහ වෙහෙරෙහි වැඩ සිටි මහ රහතන් වහන්සේ නමකගේ උපස්ථායක භික්ෂුව ලෙස කටයුතු කරන ලද්දේ මහලු කල පැවිදි වූ භික්ෂුවකි. එක් දිනක් මේ භික්ෂුව මහ රහතන් වහන්සේගේ පා සිවුරු රැගෙන උන්වහන්සේ පසුපසින් යන ගමන් “ස්වාමිනි, ආර්යයන් වහන්සේ කියන්නේ මොන විදියේ ඇත්තන්ට දැ?”යි විමසයි. එකල්හි මහ රහතන් වහන්සේ “ඇවැත්නි, ආර්යයන් හඳුනා ගැනීම දුෂ්කර කාර්යයකි. ඇතැම් මහලු අය ආර්යයන්ට ඇප උපස්ථාන කරමින්, උන්වහන්සේගේ පා සිවුරු රැගෙන උන්වහන්සේලා සමඟ එහා මෙහා යමින් ආර්යන් වහන්සේ නො දනිති” යි ප්‍රකාශ කරයි. මෙයින් පැහැදිලි වන්නේ රහතන් වහන්සේ සමීපයෙහි කොතෙකුත් ගැවසුණ ද, උන්වහන්සේ ඇසුරු කළ ද කිසිදු වෙනසක් දැක ගත නො හැකි බවකි. එහෙත් හුදකලා ජීවිතයට ප්‍රිය කිරීම, බියෙන් තොරවීම, ඇවතින් තොරවීම සහ අංගචලනවලින් විකාර නො කිරීම වැනි ලක්ෂණ රහතන් වහන්සේලාට ඇති බව ඇතැම් අටුවා කථාවල සඳහන් වෙයි.*





# ගුරු හාමුදුරුවන්ට කමටහන් දුන් ගෝල හාමුදුරුවෝ

**රහතන් වහන්සේ බියෙන් තොරය යනු ලක්දිව මුල්බැස ගත් කරුණකි. රහත් වූ සෑම භික්ෂුවක් ම බිය රහිත ව වැඩ සිටිය යුතු බව මෙයින් විශ්වාස කළා විය හැකි ය. රහතන් වහන්සේ නමක් ද නැතහොත් පෘථග්ජන භික්ෂුවක දැයි හඳුනා ගැනීමට බිය පරීක්ෂා කර බැලීමක් පෙර ලක්දිව භික්ෂූන් අතර පැවැති බව අටුවා කථාවලින් පෙනෙයි. මේ සඳහා සාධක අටුවා ග්‍රන්ථවල බහුල ව දැක ගත හැකි ය.**

එ වැනි කතා පුවතක් මජ්ජිමනිකායට්ඨකථාවේ දැක්වෙයි.

තලංගරවාසි ධම්මදින්න තෙරුන් වහන්සේ හුදකලා ජීවිතයට ප්‍රිය වූ තෙර කෙනෙකි. උන්වහන්සේගේ ආචාර්ය උච්චවාලික මහා නාග තෙරුන් වහන්සේ උගත් සිල්වත් තෙර කෙනෙකි. උන්වහන්සේ නිතර රහත් තෙර කෙනෙකු ලෙස පිළිවෙත් පුරමින් ජීවත් වූ හ. උන්වහන්සේට හැට වයස් වුව ද තමන් වහන්සේ රහත් තෙර නමක් නොවන බව නො දැන සිටියහ. මේ මුළාවෙන් මුදවාලිය යුතු බව සිතූ ධම්මදින්න තෙරුන් වහන්සේ තම ආචාර්යයන් වහන්සේ වැඩසිටි විහාරයට වැඩම කොට හෙතෙම මඳ වේලාවක් සතුටු සාමීචියෙන් පසු වී “ඔබ වහන්සේ රහත් වූයේ කවදා ද?”යි විමසී ය. හෙතෙම “හය අවුරුද්දකට කලින් යැයි පිළිතුරු දුන් විට “ඔබ වහන්සේට සමාධි බලයක් ඇද්ද?” යයි විමසී ය. “එසේ යැයි පිළිතුරු දුන් හෙයින් එසේ නම් “ඔබ වහන්සේගේ ඍද්ධි බලය යොදා භයංකර වේගයෙන් ඔබ වහන්සේ වෙත එන ඇතෙකු මවනු මැනැ”යි ධම්මදින්න තෙරුණුවෝ ඉල්ලා සිටියහ. මහානාග ස්ථවිරයෝ තම ගෝලයා ඉදිරියෙහි දෙවැනි විය නොහැකි හෙයින් ඇතකු මවාලූවත් තමා මැවූ ඇතා සොඬ මුවෙහි ලා ගෙන භයංකර ලෙස කුඤ්චනාද කරමින්, තර්ජන ලීලාවෙන් තමා වෙත එනු දැක හුනස්නෙන් නැගිට දුවන්නට වෑයම් කළහ. එහෙත් ධම්මදින්න තෙරුන් වහන්සේ ගුරු හිමියන්ගේ සිවුරු පොටින් අල්ලාගෙන “ස්වාමිනි, රහත් කෙනෙක් නම් භය වන්නාහු ද?” යැයි ඇසූහ. ඉක්බිති මුළාවෙන් මිදුණු ගුරුහිමි තම ගෝල හිමියන් ඉදිරියෙහි “මට පිහිට වෙනු මැනවැ”යි අයැද සිටියේ ය. ගුරු හිමියන්ගේ ආරාධනය පිළිගත් ධම්මදින්න තෙරුන් වහන්සේ කමටහන් දුන්හ. මහානාග තෙරුන් වහන්සේ ද කමටහන් පුරා රහත් වූහ. මෙය සිංහල විශුද්ධි මාර්ගයේ එන කථා පුවතකි.

තව ද ධම්මදින්න තෙරුන් වහන්සේ මෙම උපාය ම යොදා මහාදත්ත නම් තෙරුන් වහන්සේ නමක් රහත් බවට පැමිණ වූ බව ද මජ්ක්ධිමනිකායට්ඨකථාවේ සඳහන් වෙයි. මෙයින් පැහැදිලි වන්නේ ලක්දිව අතීත භික්ෂූන්ගේ රහත් බව මැනීම සඳහා බිය උපයෝගී කර ගත් බවකි. මෙම කරුණ තහවුරු කෙරෙන හාස්‍ය ජනක කථා පුවත් ද මජ්ක්ධිමනිකායට්ඨකථාවෙන් ම හමුවෙයි.

ක්‍රි.ව. 103–112 කාලයේ රජ පැමිණි චන්දමුඛතිස්ස මහ රජතුමා මහා විහාරයෙහි සංඝ නායක ස්ථවිරයෝ සැබවින් ම රහත්ද? නැද්ද? යන වග පරීක්ෂා කිරීමට පරීක්ෂණයක් කළ බවක් සඳහන් වෙයි. එවක මේ හිමියෝ මහලු වයසෙහි පසු වූයේ ඇස් පෙනුම ද ඉතා දුර්වල තත්ත්වයක වූ හ. භික්ෂූන් වහන්සේලා සියලු දෙනා පිඬුසිඟා බැහැර වැඩි පසු රජ තෙමේ හෙමින් හෙමින් විහාරයට ගොස් තෙරුන් වහන්සේගේ පයට නාගයකු දෂ්ට කරන ලෙස කෙටුවේ ය. ගල් කණුවක් මෙන් නො සැලී සිටි තෙරහු කවරෙක් දැයි කියා විමසූහ. මෙයින් උන්වහන්සේ රහත් තෙර නමක බව හඳුනා ගනියි.

මෙ වැනි තවත් කථාපුවතක් මෙම අටුවාවෙහි වෙයි. එක්තරා පිණ්ඩපාතික භික්ෂුවක් තමන් වහන්සේ රහත් යැයි සිතමින් මං මුළාවී සිටියාහු ය. එහෙත් තෙරුන් වහන්සේගේ රහත්බව පිළිබඳ සැක පහළ කළ දීඝභාණක අභය නම් තෙරුන් වහන්සේ පිණ්ඩපාතික තෙරුන් වහන්සේගේ රහත් බව පරීක්ෂා කිරීමට කල්පනා කළහ. දිනක් පිණ්ඩපාතික තෙරුන් කැලණි ගඟෙහි දිය නාමින් සිටිය දී හොරෙන් දියෙන් කිමිදී ගොස් ස්ථවිරයන්වහන්සේගේ කකුල අල්ලන්නට කියා එක් තරුණ භික්ෂුවක් යැවී ය. එසේ කළ කල්හි කිඹුලෙකැයි බියට පත් පිණ්ඩපාතික තෙරණුවෝ කෑ ගසන්නට වූහ. එයින් උන්වහන්සේගේ පෘථග්ජන බව හෙළි වුණේ ය. බිය ගැන්විය නො හැකි පෘථග්ජන භික්ෂූහු ද ඇතැම් විට හමු වෙති. එ වැනි අවස්ථාවල දී ඔවුන්ගේ අර්හත් භාවය පරීක්ෂා කිරීමට රාගය සහ ආසාව උපදවන අරමුණු යොදා ගත් බවට තොරතුරු ද වාර්තා වෙයි. එ වැනි පුවත් රැසක් ද මජ්ක්ධිමනිකායට්ඨකථාවෙහි වෙයි.

ක්‍රි.ව. 127–171 අතර කාලයෙහි රජ පැමිණි වසභ මහ රජතුමා එක්තරා භික්ෂුවකගේ රහත් බව පරීක්ෂා කිරීමට අපූරු උපායක් යොදා ගත් බව කියවෙයි. රජතුමා එම භික්ෂුව දානයක් සඳහා රජ මැඳුරට වැඩම කරවා උන්වහන්සේ සමීපයෙන් හිඳ මසන් අච්චාරුවක් (ඉතා රසවත් ආහාරයක්) අනන්නට විය. එයින් භික්ෂුවගේ කටට කෙළ උනන්නට ගත් බැවින් උන්වහන්සේ රහත් කෙනකු නොවූ බව සනාථ කර ගත්තේ ය. රහතන් වහන්සේට රස තෘෂ්ණාව නොමැතිවීම මෙයට හේතු විය.

දිනක් තලංගරවාසි ධම්මදින්න තෙරුන් වහන්සේ තමා රහත් යැයි මුළා වී සිටි සිතුල්පවු වැසි භික්ෂුවකට එම භික්ෂුව විසින් ම මවන ලද මනහර ස්ත්‍රී රූපයක් දෙස බලා සිටින්නට කියා එම භික්ෂුව විසින් පුරා සැට වසක් යටපත් කර සිටි කාමාශාවන් ඉස්මතු කොට තමා රහත් නො වූ බව පෙන්වා දුන් බව ද, එය තේරුම් ගත් හෙතෙම තමන් වහන්සේ වෙතින් කමටහන් ගෙන රහත් වූ බව ද සඳහන් වෙයි.

මෙම තොරතුරුවලින් තහවුරු වන්නේ රහතන් වහන්සේට බිය ඇති නොවන බව සහ රාග, ද්වේෂ, කාම, කෝප උත්සන්න නොවන බව ය.



රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

# සැරදෑ සුනෙත්පති අභයතිස් මාහිමි



**ජීවිතයේ බල දශකයේ මධ්‍ය ලක්ෂය පසු කරමින් සිටින සුනෙත් මහදෙව් රාජමහා පිරිවෙන් විහාරාධිපති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමිපාණන්ගේ ජන්ම දිනය, අප සුරත පන්හිඳ කරා යොමු කරවන්නේ නිරායාසයෙනි. ශ්‍රී ලාංකීය භික්ෂු අධ්‍යාපනයේ ඉන්ද්‍රඛීලය බඳු විදුදය මහ පිරිවෙනෙහි දී, බාල ළපටි හෙරණ වියෙහි සිට මේ දක්වා බැඳුණු මිත්‍ර සන්ථවය මුල සිට අගටත්, අග සිට මුලටත් මා මනස තුළ චිත්‍රණය වෙයි.**

විද්‍යෝදය මහ පිරිවෙනෙහි ශිෂ්‍ය භික්ෂුවක වශයෙන් උන්වහන්සේ ගත කළ හෙරණ විය ද සංයත, දමිත, නිපුණතාවන්ගෙන් සුසැදි එකක් ම විය. නවීන පන්තියේ සිට විද්‍යෝදය පිරිවෙන් අවසානය දක්වා අනුපිළිවෙලින් පන්තියේ ප්‍රථමයා ලෙස විශිෂ්ට දස්කම් දක්වමින් සපැමිණි ගමන් මගෙහි දීප්තිය ප්‍රතීයමානනය වූයේ දක්ෂතම ශිෂ්‍යයා විසින් උරුමකම් කියනා ස්‍යාමරාජ ත්‍යාගයෙන් අභිසෙස් ලැබීමෙනි. එහි ම දිගුවක් ලෙසින් උසස් පෙළ විභාගය ඉහළ ම සාමාර්ථ හිමිකර ගනිමින් සමර්ථ ව කැලණිය විශ්වවිද්‍යාලයෙන් ගෞරව ශාස්ත්‍රවේදී උපාධිය ලැබුවේ සරසවිය තුළ සුපසන් විද්‍යාර්ථියකු ලෙසිනි. ශාස්ත්‍රපති උපාධියත්, දර්ශනපති උපාධියත්, අනුපිළ වෙලින් අත්පත් කර ගනිමින්, ඉන්දියාවේ දිල්ලි විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය (දර්ශනශූරී) උපාධිය දිනා ගත්තේ භද්‍ර යෞවනයේ සිටිය දී ම ය. උන්වහන්සේගේ ප්‍රතිබලසම්පන්න ශාස්ත්‍රෝන්නතිකාමීත්වය එමගින් මොනවට ප්‍රකට වෙයි.

ගුරුදේවෝත්තමයාණන් වහන්සේගේ අපවත්වීමත් සමග ම පැපිළියාන සුනේත්‍රා මහා දේවී රාජමහා පිරිවෙන් විහාරස්ථානයෙහි අධිපතීත්වය භාරගත් තරුණ යතිවරයාණන් ගුණ - නැණ බෙලෙන් අනූන ව සිටීම දායක කාරකාදීන්ගේ පුණ්‍ය මහිමයක් විය. ශාස්ත්‍රෝද්ග්‍රහණයේ චූඩාමාණික්‍යයක් බඳු වූ උන්වහන්සේ විහාරාධිපතීත්වයෙහි දී ශාසන භාරධාරී ගුණය ම ප්‍රකට කළහ. තත්කාලීන ව මඳක් පසු බා තිබූ සුනේත්‍රා මහා දේවී පිරිවෙන හසල ගුරු මඩුල්ලකින් ද, සුපේෂල ශික්ෂාකාමී ශිෂ්‍ය භික්ෂූන්ගෙන් ද, සිප් සතර හැදෑරීමෙහි සමත් ගිහි ශිෂ්‍යයන්ගෙන් ද පරිපූර්ණ වූයේ දිනිඳු දුටු නෙළුම් කැකුළක් විකසිත වන්නාක් මෙනි. මහල් පහකින් සමන්විත ශිෂ්‍ය නේවාසිකාගාරය, සම්මන්ත්‍රණ ශාලාව, පැපිළියාන මංසන්ධිය පමණක් නොව දුටු දුටු දනන් සිත් ශ්‍රද්ධාවෙන් ඔකඳ කරවන තේජවත් කුඹුක් දැව කැටයමින් ප්‍රභාවිත අභිනව සම්බුද්ධ මන්දිරය, ප්‍රතිසංස්කරණය වූ ධර්මශාලා මන්දිරය හා ආවාස ගෘහය, විහාරස්ථානය වටා ඉදි වූ ප්‍රාකාරය හා පිවිසුම් ද්වාරය ආදිය නෙත ගැටෙන කාගේත් ඉමහත් සම්භාවනාවට පාත්‍ර වූ නිර්මාණයන් ය.

දිවයිනේ නොයෙක් දිශාවන්ගෙන් වැඩමවන ප්‍රතිබල සම්පන්න ව්‍යක්ත විශාරද යතිවරයන් වහන්සේලා පොහෝ දින සීලභාවනා පින්කම් මාලාව අර්ථවත් කරති. උපෝසථ දිනයන්හි ජනතා ආකර්ෂණය දිනා ගත් විද්‍යුත් මාධ්‍යයන් හරවත් පොහෝ දින පින්කම් මාලාවන් දිවයිනට ම සජීවී ව විකාශනය කරති. විහාරස්ථානයේ සිදු කරන දානමය පින්කම් ආදී කොට ඇති කුදු මහත් පින්කම් කටයුතු අසදෘශ වූ පින්කම් බවට මහා සංඝ රත්නය සාක්ෂි දරනු ඇත.

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙසින් කටයුතු කළ අභයතිස්ස මාහිමියන් වහන්සේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයකු වශයෙන් කටයුතු කරන්නේ ආත්මීය උරුමයන් ස්පර්ශ කිරීමක් වශයෙනි. එයට හේතුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පිහිටා ඇත්තේ සුනේත්‍රා මහා දේවී රාජමහා පිරිවෙන් විහාරස්ථානයට උරුම ව තිබූ භූමි භාගයක වීමයි. විශ්වවිද්‍යාලීය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයත්, විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය භික්ෂූන් හා සිසු දරුවන් අතරත් උන්වහන්සේ සම්භාවනාවට පත්ව සිටින්නේ දැනුම නම් වූ දිය පාත්‍රයේ පතුළ ස්පර්ශ කරමින් ගිලීගත් ඉදිකටුවක් හා සමාන නිසා පමණක් නොව පියකුගේ බඳු දයාබර දෑත් ඔවුන් වෙත දායාද කරන බැවිනි. ඊට දිය හැකි පුංචි උදාහරණයක් වන්නේ දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාලීය දූවා දරුවන් වෙනුවෙන් උන්වහන්සේගේ තනි උත්සාහයෙන් ආරම්භ කළ කථන ග්‍රන්ථ ව්‍යාපෘතිය යි. එය වර්තමානයේ විශ්වවිද්‍යාලය තුළ පිළිගත් ව්‍යාපෘතියක් බවට පත් වූයේ උන්වහන්සේගේ ශ්‍රමය, ධනය හා කැපවීම සමග බැඳුණු හදවතේ තෙත්දියෙනි.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ බරසාර බව ආරක්ෂා කර ගැනීම පිණිස උන්වහන්සේ කැප වන්නේ ඉහළ පාලනාධිකාරය සමග පවා සාකච්ඡා සම්මුතීන්හි ව්‍යුත්පන්න වෙමිනි. අධ්‍යාපනික වශයෙන් පමණක් නොව ජාතික හා ආගමික වශයෙන් ද ඉටු කරන කාර්ය භාරය සුවිශාල ය. රටට, ජාතියට හෝ ආගමට විපත්කාරී තත්ත්වයන් පැන නඟින විට මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමිපාණන්ගේ ස්ථාවරය කවරක්දැයි සබුද්ධික ජනයා විමසිලිමත් වෙති.

හිසට වහළක් නැති අන්ත අසරණ පවුල් බොහොමයක් උන්වහන්සේගේ සරණ ලබා නිවසක හිමිකාරීත්වයේ අභිමානය භුක්ති විඳිති. දුෂ්කර ප්‍රදේශවල විහාරස්ථාන කිහිපයක් සංවර්ධනය වී ඇත. සිසු දරුවන් ශිෂ්‍යත්වයන් ලබන අතර ම, අනාගත මාතෘත්වය ඉසිලීමට සූදානම් වන ගැබිණි මව්වරු අනේකවිධ පහසුකම් ලබති. ආබාධිත තත්ත්වයන්ට පත් වූවෝ රෝද පුටු, කිහිලි කරු ආදිය ලැබ අභිනව ජීවිත ලබති.

මැදගොඩ හිමිපාණන් වෙත මා හදවත ගෞරවාන්විත වන ප්‍රබලම සාධකය වන්නේ බුද්ධ පුත්‍රයකු වශයෙන් උන්වහන්සේ සිදුකරන මව්පිය උවටැනයි. රාජ මහාමාත්‍යාදීන් මධ්‍යයේ ද උන්වහන්සේ හිස දරණ කිරුළ මව්පියන් ම ය. කළුරිය කළ සදාදරණීය මෑණියන් රෝගාතුර වූ අවස්ථාවේ සියතින් උවටැන් කරමින්, ඇතැම්විට එතුමිය ඇලුම් කරන ආහාර පාන පවා සියතින් ම සකසා දෙමින් දයාබර පුතකුගේ සෙනෙහස විදාරණය කර දක්වන ලදී. එතුමියගේ තදබල රෝගී තත්ත්වය මධ්‍යයේ සිය කාර්යය බහුල බව මනාව කළමනාකරණය කර ගනිමින් සූවිසි පැයේ ම කැපකිරීම් කළේ අපට ද එය එලෙසින් ම කොපිකර ගැනීමට ඉඩ හසර ලබා දෙමිනි. පරලෝ සැපත් මෑණියන්ගේ ගුණ කදම්භයට උපහාර දැක්වූයේ ඇඹිලිපිටිය ප්‍රදේශයේ දුෂ්කර විහාරස්ථානයක දාගැබක් ඉදිකරවීමෙනි. දයාබර ස්වාමිදියණියගේ වියෝවෙන් ස්නේහාතුර වූ පියාණන් සිය සෙවනැල්ල මෙන් සමීපයේ රඳවා ගනිමින් පුත්‍ර ස්නේහය දක්වන්නේ වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම බුදු පුතකු විලසිනි.

ධර්මයටම ආශක්ත වූ නිසඟ දේශන කෞශල්‍යය මුළු මහත් දේශයක් ධර්මාධිගමයෙහි පිහිටුවීමට සමත් ය. මහාචාර්ය හිමියන්ගේ දේශනා කෞශල්‍යය විටෙක අප මවිත කරන්නකි. ගැඹුරු ධර්ම කරුණු තුළ කිමිදෙන උන්වහන්සේ ශ්‍රාවකයන්ගේ ධර්ම පිපාසය සිහිල්දිය දහරාවන්ගෙන් සනසවයි. කුදු මහත් ධර්ම විවරණයන් මනාව හසුරුවමින් අටුවා - ටීකා - සන්න - ගැටපද විවරණිකාවන් සහිත ව පෙළ දහමෙන් සුපෝෂිත වූ රසාලිප්ත ධර්ම ඖෂධයක් බවට එකී දේශනාවන් පත් කරයි. ධර්ම සාකච්ඡා සම්මන්ත්‍රණයන් සිදුකරන අවස්ථාවල දී විචාරක ප්‍රශ්නයෙන් ඉවත නොපැන එක එල්ලේ ම හරවත් වූත්, බුද්ධිමය ස්පර්ශයට සුදුසු වූත්, ඉතා සරලව කිවහොත් ඇඟට දැනෙන්නා වූත් විවරණයන් සපයන්නේ සුමට සුගම ලාලිත්‍යයෙනි.

පෙර විවරණිත සියල්ල හා සමග අභයතිස්ස හිමියන්ගේ කල්‍යාණ මිත්‍ර සන්ථවය අත්විඳි අයකුට කල්‍යාණ මිත්‍රත්වයේ රූපකය උන්වහන්සේ ම ය. අතිශය කාර්ය බහුලත්වය මැද වුව ද මිත්‍රයන්ට, මිත්‍රත්වයේ දෑත් දිගු කරන්නේ "භික්ෂු සසුන පවතින්නේ සම්පූර්ණයෙන් කල්‍යාණ මිත්‍රත්වය මත යැයි" වදාළ බුදු වදනට වටිනාකමක් ලබා දෙමිනි. ඒ අපරිමිත ස්නේහය ගලා එන හදවත, හදවතින් ස්පර්ශ කරමින් ළබැඳි සුවය විඳීමට හුදෙක් මා පමණක් නොව ඒ ළබැඳි මිතුදමට සමීප සැම දෙනෙක් ම පාරමී පූරන බව සක් සුදක් සේ දනිමි.

***මහාචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස මාහිමියනි, චිරං ජයතු !***
***ළදළු බෝ පතක් ලෙද සාධු සිත පතුරුවන***
***දම් අමා රැස් විදා ලෝ සතට සුව සදන***
***ආයු බෝ සෙත වඩා අජානය හයකු ලෙද***
***පිය නඟනු මැන සමිඳ***
***අරුත්බර දිවිය තුළ....***

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආචාර්ය
**කුඹුකේ චන්ද්‍රාලෝක හිමි**

## ජීවිතය

| | |
|---|---|
| තණ අග රැඳි පිනි බිඳකිය | ජීවිතය |
| පහන් දැල්ල මෙන් නිවී යයි | ජීවිතය |
| සතුටක් එක්ක කල් යවනා | ජීවිතය |
| කවුරුත් කිසි දිනක නොසිතන | ජීවිතය |
| | |
| තරුණ වියේ ජීවිතයට සතුට | සොයනවා |
| මැදියම් වියේ කොයි කවුරුත් සුවය | පතනවා |
| මහලු වියේ කවුරුත් බණ පොත් | පෙරළනවා |
| දිවියේ අරුත නම් එකලට | වැටහෙනවා |
| | |
| පින් පව් දෙකක් ඇත මෙලොවේ | දැන ගන්න |
| නිවන උතුම් හැකි කාටත් එහි | යන්න |
| දන් පින් කළොත් නිරතුරු සිත | සතුටින්න |
| හැකි වේ සසර සයුරෙන් හැම | ගොඩ යන්න |

***සියඹලෑවේ රාහුල හිමි***
සිරිමල් වත්ත, ගාල්ල
දිවුල්දෙණිය

## ඇය සදහම් බෙදන්නී

කිරණ විහිදුවන
ළා හිරු
ඉද්දමල් පිපිණු
ගුරුපාරදිගේ
සුදු ඔසරියක් ඇට පොටක්

දිගට ගෙතුන වරලසක්
මිරි වැඩි සඟළක්
නොපැළඳ පා
ඇදෙන්නී ය දම් පියසට

ගුරු මෑණී.....

සුදෝ සුදු මල් වට්ටියක්
පුදසුනේ පුදන්නී
ලාභ පැසසුම් නොලැබ
දම් බිඳක් බෙදන්නී...

මුදුවදන් කියන්නී
සෙනෙහසින්
යහ මඟට මං සදන්නී.

***අතුරල අලංකාර***
බලපිටිය

## සැනසීම




| | |
|---|---|
| අප ඉපදුණේ යම්කිසි හේතුවක් | මතයි |
| සැප දුක ලැබ දෙන්නේ හේතුවෙ ඵලය | නිසයි |
| දැන් ඇති සසර සැරි සැරවා මරුව | වසයි |
| හේතුව නසා සැනසෙමු අයුෂය | ටිකයි |
| | |
| හේතුව නසන සම්බුදු අරි අටඟි | මඟයි |
| මිච්ඡා දිට්ඨි සිත දරදඬු සසර | දිගයි |
| ලෝභ දෝෂ මෝහය දුරලීම | හොඳයි |
| සම්මා සංකල්ප දිට්ඨිය නසන | මඟයි |
| | |
| සම්මා දිට්ඨියෙන් ලොව දෙස බලන | කල |
| දස අකුසලෙන් වෙන් වෙයි සිත කර්ම | ඵල |
| සම්මා වාචා ආජීවය වැඩෙන | කල |
| අධි ශීලයකි තැන්පත් සිත අවධි | කළ |
| | |
| දස අකුසලෙන් වෙන්වෙයි සිත | සමාධිය |
| දුක නිවි නිවී යයි සමුදයේ | මාර්ගය |
| සංයෝජනා විසිරෙයි ප්‍රඥ | සතිය |
| සම්මා ඥාන විමුක්තිය දෙයි | නිරෝදය |
| | |
| කලකිනි කලණ මිතුරකු දිවියට | එන්නේ |
| අවබෝධයෙනි චතුසත්‍යය | පවසන්නේ |
| ඇයි අප තව ම කල්මරමින් පසු | වන්නේ |
| අධිටන් කරමු දිරි දෙමු ඵල ලැබ | මින්නේ |

***ගොතටුවේ අග්ගමිත්තා මෙහෙණින් වහන්සේ***
සුදර්ශන ධර්ම නිකේතනය
වැරැල්ලවත්ත, ගම්පහ

# පහන් සිතක කවි

✍ දීපා පෙරේරා



## පුදුමයි! ඒත් ඇත්තයි

ගඟට පැන
ගංදියේ ගිලෙමින්
නැවත සැණෙකින්
උඩට ආ කල

පෙර තිබූ ගඟ ද නැත
පෙර සිටිය මම ද නැත
සියලු දේ වෙනස් වී
අතුරුදන් වී ගිහින්

***කේ. ඩබ්ලිව්. සිරිසේන***
මාලබේ

## සසර සිත්

**දැවි දැවී යනවා**
**වැලලී යනවා**
**දිනයක මේ කය**
**නොපෙනී යනවා**

**කඳ මළු බඳිනවා**
**හැරී බලනවා**
**මදි බව දැනෙනවා**
**බරටම බඳිනවා**

**මල්ල ලෙහනවා**
**හිස් බව පේනවා**
**පව් එහි තිබෙනවා**
**පින් නැති වෙනවා**

**කළ පින් සැප වී**
**කළ පව් දුක් වී**
**පසු පස එනවා**
**කර්මය පල දී**

**හෙමිහිට හෙමිහිට**
**ගමනක් එනවා**
**හෙමිහිට නො පෙනෙන**
**ගමනක යනවා**

**ඉපදෙන මැරෙනා**
**කව්රුත් යනවා**
**පව් කළ සිත්**
**හඬමින් යනවා**

**හිනැහී යනවා**
**එතෙර ව යනවා**
**පින් කළ සිත්**
**නිවනට යනවා**

***නීතිඥ කීර්ති කපුවත්ත***
රිදීගම



## යසෝධරාවෙනි

| | |
|---|---|
| තමා හැර ගිය තම හිමිගෙ | ගුණ |
| ගයන්නට ඔබෙ පහන් විය | නැණ |
| උත්තමාවියෙ ඔබය දින | මිණ |
| පතිදහම් මඟ සදා ජය | මිණ |

***රත්නසේකර රූපසිංහ***
කිතුල්ගල



## වඳිමු කූරගල පුදබිම

| | |
|---|---|
| මහ ගල්තලා තැන තැන ඇත | පේර පැළ |
| වන තුරුලතා මැද ගස්වල | වීර පල |
| බුදු පිළිරුව චේති බෝධිය | දේවි බල |
| ඇස් දෙක කුමට? නොදැකපු මෙම | කූරගල |
| | |
| ආදී පින්වතුන් දී ඇත | වීර බල |
| එනිසම අනාගතයෙදි දේ | සාර පල |
| බැලුවම කන්ද මුදුනේ සිට | මහා හෙල |
| රටට ම වාසනා ඉපැරණි | කූරගල |
| | |
| තරුණ පිරිස – ධනවත් අය | සූර පිල |
| මේ අය හට තිබේ සිතනට | ධීර බල |
| එම වැනි අය සිටිය යුතු මෙහි | පාර මුල |
| එක් වී ගොඩනගමු පුදබිම | කූරගල |
| | |
| වතුරකුඹුරේ හිමි සඳ අපෙ | නෙල්ලිගල |
| ශක්තිය පුදා ඇත මෙතැනට | දෙන්න බල |
| සපැමිණ පින්වතුනි ඔබසැම | ගන්න මුල |
| රටවැසි සැමට ඇරයුම – එමු | කූඹරගල |

***ආරියරත්න මාතොටගම***
බලන්ගොඩ පින්නවල



## මා දුටු ගම

ගම පුරා තිබූ ඒ – පුංචි මැටි ගෙවල් පොඩි
පැදුර දැමූ ඉදිරි පිල – මිදුලෙ තිබූ පිච්ච වැල

සමනල බිඟු කැළ – මල් පඳුර වසා සිටි
ඒ සොඳුරු දසුන් නැත – කොයි ද අද දකින්නට

වෙල් යාය පුරාවට – ඇවිද ගිය ගව රංචු
තුටින් සෙල්ලම් කෙරුව – පුංචි දරු කැළ කොයි ද

මී ගවයො වෙල පුරා – සිටිය යුරු තණ කකා
උන්ගෙ ඇඟ මස් ද – දන් දුනි ද මිනිසුන්ට

දර මිටිය හිස තබා – පළා මිටි ඉණ ඔතා
වෙරලු ගෙඩි අත තබා – ගෙනා ඇය කොයි කියන්

යහගුණය පිරී ගිය – මිනිසුන්ගෙන් පිරුණ
සොඳුරු බව පිරුණ ගම – අද අඳුරුවී කිම් ද

***චන්ද්‍රා සිරිසීලි වික්‍රමාරච්චි***
ගම්පහ නැදුන්ගමුවේ

## කවි කිවිඳියනට සතර පෝ දාටම දහම් තුටු පඬුරු

**බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්වජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදාට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.**

## බුදුසරණ පහන් සිතක කවි

BCC

| | |
|---|---|
| **සම්පූර්ණ නම** | :– ............................................................ |
| **ලිපිනය** | :– ............................................................ |
| **දුරකථන අංකය** | :– ............................................................ |

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.**



# ත්‍රිපිටකය පිළිබඳ නිවැරැදි ධර්ම ඥානයක් ලබා ගැනීමෙන්

# සම්බුද්ධ ශාසනය බබළවන මහ තෙරනමක් විය හැකියි



උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ රත්මලේ දන්දෙණිය දකුණ මිල්ලගිරි විහාර ධර්මායතනාධිපති බෙලිඅත්ත නිහිළුව සිරි ධම්මානන්ද පරිවේණාධිපති ශ්‍රී රෝහණ සංඝ සභාවේ ගරු විධායක සභික රාජකීය පණ්ඩිත ත්‍රිපිටකාචාරිය දර්ශනපති හත්තොටුවේ ඉන්දරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.

**පුංචි කාලයේ සිටම ශාසනික ජීවිතය ඇලුම් කළ ඔබ වහන්සේ උසස් ජීවන දර්ශනයක් ගොඩනඟාගත් ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් කටයුතු කිරීමට ගුරු හාමුදුරුවන් වහන්සේලාගෙන් ලැබුණ ආභාසය මොන වගේ ද? අපේ හාමුදුරුවනේ,**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වන හත්තොටුව කියන බොහොම සුන්දර ගැමි පරිසරයක තමයි මම උප්පත්තිය ලැබුවේ. මගේ පියා විමලසේන ලොකුකරවිට මහත්මා සහ මගේ මෑණියන් අබේවික්‍රම බමුණුසිංහ කංකාණම්ගේ ආරියවතී මහත්මිය, ගොවිතැන ජීවනෝපාය කරගෙන බොහොම ධාර්මික ව ජීවත්වුණ ශ්‍රද්ධාවන්ත ගුණගරුක මව්පිය දෙපළක්. මා ඇතුළු ව සහෝදර සහෝදරියන් තුන් දෙනකු සිටි පවුලක 1978 වර්ෂයේ නොවැම්බර් මස 20 වැනි දින ජන්ම දායාදය ලැබුවා. කුඩා කාලයේ සිට ම බොහොම ශ්‍රද්ධාවෙන්, ශාසනික ලැදියාවෙන් කටයුතු කිරීමට ලොකු රුචිකත්වයක් මා තුළ තිබුණා. බොහොම ආසාවෙන් දහම් පාසල් ගියා. ඒ වගේ ම නිතර ස්වාමීන් වහන්සේලා සමීප ව ඇසුරු කිරීමටත්, නිතර ම විහාරස්ථානය ට යාමත් පුරුද්දක් ව පැවතුණා. එම ආසාව නිසාම මව්පියන්ගේ ආශිර්වාදය ඇතිව පැවිදිවීමේ අරමුණින් මාතර පහළ ජීක්වැල්ල පත්ථාරාම පුරාණ විහාරස්ථානය වෙත පැමිණිලා ශාසනික වත් පිළිවෙත් පුරුදු පුහුණු වීමට කටයුතු කළා.

මාතර පළාතේ ප්‍රධාන සංඝ නායක, ශ්‍රී රෝහණ සංඝ සභාවේ විධායක කාරක සංඝ සභික විචිත්‍රභාණී ඌරුමුත්තේ සෝමරතන නායක හාමුදුරුවන් වහන්සේ හා කිතලගම බුද්ධප්‍රිය ලොකු හාමුදුරුවන් වහන්සේ යන හාමුදුරුවන් වහන්සේලා දෙනමගේ ආචාර්යත්වයෙන් 1990 වර්ෂයේ දී උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ පැවිදි බව ලබන්නට සංසාරගත පුණ්‍ය ශක්තිය බලවත් වුණා. ඒ වගේ ම 1999 වර්ෂයේ දී මාතර තිහගොඩ ඌරාපොල සිරි රතනජෝති පරිවේණස්ථ ශ්‍රී රෝහණ සංඝ සභා මූලස්ථානයේ දී මා පැවිදි කළ ගුරුදේවෝත්තමයාණන් වහන්සේලාගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙන් උතුම් අධිශීල සංඛ්‍යාත උපසම්පදා පුණ්‍ය කර්මය සිදු වූ බව පුණ්‍යානුමෝදනා පූර්වක ව සිහිපත් කළ යුතුයි. මා පැවිදි කළ දා පටන් අවවාද අනුශාසනා ලබා දෙමින්, ශාසනික ප්‍රතිපදාවන් පුරුදු පුහුණු කරමින්, භික්ෂුත්වයට උරුම වූ උත්තරීතර පූජනීයත්වයට පත්වීමට විශාල මග පෙන්වීමක් සිදු කළ උතුම් යතීන්ද්‍රයන් වහන්සේලා ගෞරව පූර්වක ව කෘතවේදී ව මේ අවස්ථාවේ දී සිහිපත් කළ යුතු යි. උන්වහන්සේ ලබා දුන් අවවාද අනුශාසනා පිළිපදිමින් ගුරු හාමුදුරුවන් වහන්සේ වෙත කීකරුව, ගුරු සිත නොරිදවා ධර්ම ශාස්ත්‍රය ලබා ගැනීමට සැම විටම වගබලා ගත්තා.

**ඔබ වහන්සේ ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලබාගත් අවධිය පිළිබඳව පැහැදිලි කරන්න හාමුදුරුවනේ,**

පැවිදිවීමෙන් අනතුරුව නායක හාමුදුරුවන් වහන්සේගේ මඟ පෙන්වීම යටතේ මාතර මිගදායේ සිරි රතනපාල පිරිවෙනින් මූලික පිරිවෙන් අධ්‍යාපනයත්, කිතුලේවෙල ජයමහා විහාර මහ පිරිවෙනින් උසස් අධ්‍යාපනයත් ලැබුවා. කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය මහ පිරිවෙනින් ප්‍රචීන අධ්‍යාපනය ලබා ගැනීමට කටයුතු කළා. ඒ වගේ ම පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය, කැලණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය, රුහුණු විශ්ව විද්‍යාලයෙන් දර්ශනපති උපාධිය ලබා ගත්තා. 2001 වර්ෂයේ දී ප්‍රාචීන භාෂෝපකාර සමාගමෙන් පවත්වනු ලබන ප්‍රාචීන අවසාන විභාගයෙන් උසස් ලෙස සමත්වීමෙන් රාජකීය පණ්ඩිත උපාධිය, සුමංගල ගුණානුස්මරණ සභාවෙන් පවත්වන ත්‍රිපිටකාචාර්ය විභාගයෙන් සමත් ව ත්‍රිපිටකාචරිය උපාධිය ලබා ගැනීමට කටයුතු කළා.

**ඔබ වහන්සේ ගේ ධර්ම ශාස්ත්‍රීය සේවයත්, ජාතික, ආගමික, ශාසනික සේවයත් පිළිබඳ යම් පැහැදිලි කිරීමක් කරනවා නම්, හාමුදුරුවනේ,**

අටුවා තුනක් පරිවර්තනය කර තිබෙනවා. පාලි අට්ඨකථා සාහිත්‍යයෙන් හෙළිවන සිහළ අට්ඨ කථා උපාධි නිබන්ධනය ග්‍රන්ථයක් වශයෙන් පළ කළා. සංයුක්ත නිකාය අට්ඨ කතා දෙවන භාගය, ථේර ගාථා අට්ඨ කථා පළමු භාගය ,මහානිද්දේසට්ඨ කතා පොත ආදී ග්‍රන්ථ සිංහලයට පරිවර්තනය කර තිබෙනවා. පුස්කොළ පොත් ඇසුරින් අටපිරිකර දානානිසංස ග්‍රන්ථය රචනා කළා. දීඝ නාකිය ඨීකා පාඨික වර්ගය සිංහලට පරිවර්තනය කළා. විශාඛා මහා උපාසිකාව ග්‍රන්ථය, ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයට නියමිත පාලි නිර්දිෂ්ට ග්‍රන්ථ එකතුව ඇතුළත්ව තවත් ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් රචනා කළා. ඒ වගේ ම පුවත්පත් සඟරා වෙනුවෙන් ධර්ම ශාස්ත්‍රීය ලිපි පළ කර තිබෙනවා.

බෙලිඅත්ත ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වන නිහිළුව ධම්මානන්ද මහ පිරිවනේ ආරම්භක පරිවේණාධිපතීන් වහන්සේ වශයෙන් 2003 වර්ෂයේ සිට වර්තමානය දක්වා ස්වාමීන් වහන්සේලාට ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා දීමට කටයුතු කරනවා.

දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත්වන මිල්ලගිරි විහාර ධර්මායතන විහාරස්ථානය සැදැහැවතුන්ගේ ආධාර උපකාර ඇතිව අංග සම්පූර්ණ විහාරස්ථානයක් ලෙස ඉදිකිරීමට කටයුතු කළා වගේ ම සිරි සරණාගමණ දහම් පාසලේ ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේ වශයෙන් ප්‍රදේශයේ දරුවන්ගේ දහම් අධ්‍යාපනය දියුණු කිරීමට කටයුතු කරනවා. ප්‍රදේශයේ සමිති සමාගම් රැසක අනුශාසකත්වය ලබා දෙමින්, සභාපතිත්වය දරමින් ප්‍රදේශයේ සුභසාධනය, සංවර්ධනය වෙනුවෙන් කැප වෙනවා.

ඒ වගේ ම ශ්‍රී රෝහණ සංඝ සභාවේ විධායක සභික හාමුදුරුවන් වහන්සේ නමක් වශයෙන් සම්බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් කැපවී කටයුතු කරනවා. 2019 වර්ෂයේ සිට ශ්‍රී රෝහණ සංඝ සභාවෙන් මාසිකව පළ කරන ශ්‍රී රෝහණ පුවත්පතේ ප්‍රධාන සංස්කාරක ලෙස කටයුතු කරමින් ශ්‍රී රෝහණ සංඝ සභාවට ශක්තියක් වෙමින් වැඩ සිටිනවා.

**පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් පිරිවෙන් අධ්‍යාපනය ලබන පොඩි හාමුදුරුවන් වහන්සේලාට ලබා දෙන උපදෙස් මොන වගේ ද? අපේ හාමුදූරුවනේ,**

පොඩි හාමුදූරුවන් වහන්සේලාට නිතරම අනුශාසනා කරන්නේ දායකයන්ගේ සිත පැහැදෙන ආකාරයට කටයුතු කරන්න අවශ්‍ය කරන බවයි. මාසයකට දෙවතාවක් කෙස් රැවුල් බාල ප්‍රසාදජනක ව, පිරිසුදු ව, සංවරශීලී ව, බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි ම ශ්‍රමණ පිළිවෙත් අනුගමනය කරමින්, සීලය ආවර්ජනා කරමින් ශීලවන්ත ව ස්වාමීන් වහන්සේ නමකට අදාළ නියමිත අධ්‍යාපන කටයුතු සිදු කළ යුතු යි. ගුරු සිත නොරිදවා, ගුරුදෙවෝත්තමයාණන් වහන්සේගේ අවවාද අනුශාසනා පිළිපදිමින්, භාෂා ශාස්ත්‍ර දැනුම ලබා ගෙන ත්‍රිපිටකය හොඳින් ඉගෙන ගෙන නිවැරැදි ධර්මඥාණයක් ලබා ගැනීමෙන් සම්බුද්ධ ශාසනය බබළවන මහතෙර නමක් වන්නට හැකියාව ලැබෙනවා . පාලි, සිංහල, සංස්කෘත භාෂාව මූලික කරගෙන මැනවින් අධ්‍යාපනය ලබා ගැනීම අවශ්‍යයි.

හේමමාලා රන්දුනු

# තෙමසකට පෙර අපවත්වී වදාළ

## කහතුඩුවේ විමලතිස්ස නාහිමි



යම් ප්‍රදේශයක ජනතාවගේ සාමාජික ආගමික කටයුතු ප්‍රවර්ධනයට අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනා කිරීම, ප්‍රදේශයේ බෞද්ධ දායක දායිකාවන්ට පින් රැස් කිරීමට උදවු උපකාර සැලසීම හා ඔවුන්ගේ දියුණුවට හා සසරින් එතෙර වීමට අනුශාසනා කිරීම අපේ මහා සංඝ රත්නයේ ප්‍රමුඛ කාර්ය භාරයන් අතර වේ.

ඒ සියලු දේ ඉටු කරමින් උජුපටිපන්න ගුණයෙන් යුක්තව කහතුඩුව පුරවරයට පමණක් නොව ග්‍රාම නිලධාරී වසම් 30 කින් පමණ සමන්විත මුළු උඩුගහපත්තුවට සුවිශේෂී ආගමික සේවයක් කළ කහතුඩුව ශ්‍රී නන්දනාරාමාධිපති කහතුඩුවේ විමලතිස්ස හිමිපාණෝ අපවත්වී සැප්තැම්බර් 14 වැනිදාට තෙමසක් සපිරේ.

උඩුගහපත්තුවේ පැවිදි සංවිධානයේ සභාපති ලෙස උඩුගහපත්තුවේ ජනතාවගේ ආගමික සාමාජික දියුණුවට වසර 60 කට අධික කාලයක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ සුපේෂල ශික්ෂාකාමී උන්වහන්සේ අපේ සඟ පරපුරට සුවිශේෂී ආදර්ශයක් දුන්නේ ආගන්තුක සත්කාරය මඟිනි.

තමන්ට ලැබුණු විශ්‍රාම වැටුප මෙන් ම පින්කම්වලට ගොස් ලැබෙන පිරිකර ආදී සියලු දේ ආගන්තුක සත්කාරය වෙනුවෙන් කැප කළ, උඩුගහපත්තුවේ සෑම ශාසනික කටයුත්තක දී ම පෙරමුණ ගත් කහතුඩුව ශ්‍රී නන්දනාරාමයේ මෑත දියුණුවේ ප්‍රමුඛයාණන් වූ කහතුඩුවේ විමලතිස්ස හිමිපාණෝ උඩුගහපත්තුවේ මහ සඟ පරපුරට නායකත්වය දුන් විනයධර සංඝ පීතෘවරයන් වහන්සේ නමකි.

අවුරුදු 30 කට අධික කාලයක් පාසල් හා විද්‍යායතන ගණනාවක දහම් ආචාර්යවරයකු ලෙස සිටි කහතුඩුවේ විමලතිස්ස හිමිපාණෝ රටේ විවිධ පළාත්වල සිසු දරු දැරියන් දහස් ගණනකගේ සාර ධර්ම ප්‍රවර්ධනයට කටයුතු කළහ.

හොරණ විද්‍යාරතන මහ පිරිවෙන, බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය, වැතර මහා විද්‍යාලය හා ආනන්ද ශාස්ත්‍රාලය උන්වහන්සේ සේවය කළ අධ්‍යාපන ආයතන අතර ප්‍රමුඛත්වය ගනී. විශේෂයෙන් බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ උන්වහන්සේ සේවය කළ වසර 15 ක කාලයේදී ප්‍රදේශයේ ආගමික සාමාජික හා ජාතික උන්නතිය සඳහා විවිධ වැඩ කටයුතු රැසක් ඉටු කළ බව ඒ ඒ ප්‍රදේශවල ජනතාව සිසු දරු දැරියන් පවසන්නේ ඒ පිළිබඳ නමස්කාර පූර්වක හද පිරි කෘතඥතාව පළ කරමිනි.

කහතඩුවේ විමලතිස්ස හිමියන් කහතුඩුව ශ්‍රී නන්දනාරාමයේ විහාරාධිපති ධූරයට පත්වන්නේ 1987 දී ය. එදා සිට අපවත්වෙන තුරු උන්වහන්සේ කහතුඩුව ශ්‍රී නන්දනාරාමයේ අභිවෘද්ධියට ඉමහත් සේවයක් ඉටු කළහ.

ඒ අයුරින් වසර 30 ක් මෙරට සිසු පරපුරේ ඥානය නංවාලමින් හා තවත් වසර 30 ක් කහතුඩුවේ ද උඩුගහපත්තුවේ ආගමික සාමාජික කටයුතුවල නායකත්වය ගෙන කටයුතු කළ ශාස්ත්‍රපති මුළුදිවයිනට ම සාම විනිසුරු කහතුඩුවේ විමලතිස්ස හිමිපාණන්ට නිවන් සැප ලැබේවායි! අපි ප්‍රාර්ථනා කරමු.

නිහාල් පී. අබේසිංහ



# යළි පිබිදෙන ඓතිහාසික කඳුළුව ඉහළ පෝයමලු රාජමහා විහාරය



ඉබ්බාගමුව කඳුළුව ඓතිහාසික ඉහළ පෝයමලු රාජමහා විහාරය අනුරාධපුර යුගයට අයත් නටබුන් සහිත පුදබිමකි. විනාශ වී ගිය ශෛලමය බුද්ධ ප්‍රතිමා වහන්සේ, මහ රහතන් වහන්සේ වැඩසිටි බව අනුමාන කෙරෙන කටාරම් කෙටූ ගල්ලෙන් ඇතුළු නටබුන් මෙහි විසිර පවතී.

මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ මෙහෙයවීමෙන් සියම් ජාතික උපාලි මහ තෙරුන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය විසින් ලක්දිවට වැඩම කොට, නැති වී ගිය උපසම්පදා විනය කර්මය යළි මෙරට පිහිටුවීමෙන් පසු රටෙහි විවිධ ස්ථානවල විනය කර්ම සිදු කිරීම සඳහා සීමා සම්මත කරවන ලදි. සංඝරාජ හිමියන්ගේ ද්විතීය ශිෂ්‍ය වූ දරම්ටිපොළ ධම්මරක්ඛිත හිමියන් වැඩ සිටි කඳුළුව ඉහළ පෝයමලු විහාරය ද මෙලෙස සීමා සම්මත කළ පෞරාණික පුදබිමකි. කාලයාගේ ඇවෑමෙන් මෙම පුදබිම විනාශයට පත්ව වනගත වූ අතර, පහළ භූමියෙහි සියලු විහාරාංග තනවා මැදිරිය රජමහ විහාරය ලෙස හඳුන්වමින් ආගමික කටයුතු සිදු කර ඇත.

සියම් මහා නිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහානායක අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහා නාහිමිපාණන් වහන්සේගේ අනුශාසනා පරිදි විනාශයට පත් ඓතිහාසික ඉහළ පෝයමලු විහාරස්ථානය මුළුමනින් ම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පසුගිය දා මූලික කටයුතු සිදු කෙරිණි. මල්වතු මහා විහාරවාසී, ඓතිහාසික දන්තුරේ රාජමහා විහාරය, කඳුළුව මැදිරිය රාජමහ විහාරය ඇතුළු විහාර ගණයේ අධිපති, කර්මවාගාචාර්ය, ධර්මාචාර්ය දන්තුරේ විපස්සි නාහිමිපාණන් වහන්සේගේ මූලිකත්වයෙන් සතර පේරුවේ දායක පිරිසගේ ශ්‍රම දායකත්වයෙන් වනගත ව පිහිටි පෞරාණික විහාර බිම එළි පෙහෙළි කිරීම් කටයුතු ආරම්භ කරන ලදී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි පෙර රජ දවස පැවති ශ්‍රී විභූතියෙන් මෙම පුදබිම සැදැහැවතුන්ට වන්දනාමාන කිරීමට සුදුසු පුණ්‍ය භූමියක් ලෙස සංවර්ධනය කිරීමට විහාරාධිපති දන්තුරේ විපස්සි නාහිමිපාණන් වහන්සේ අපේක්ෂා කරති.



# අමරපුර රාමඤ්ඤ දෙනිකායේ නායක පදවි

**වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ ශිෂ්‍ය හිමිනමක වූ වටරක්ගොඩ ධම්මපාල මාහිමියන්ගේ ශිෂ්‍යවර බෝවල ධම්මානන්ද හිමියන් සමීපයේ පැවිදි ව මහනුවර මල්වතු මහාවිහාරයේ ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණයේ නිරත වූ වැලිතර මහකරාවේ ඤාණවිමලතිස්ස හිමිපාණෝ සංඝරාජ හිමියන්ගේ නිර්දේශය ද ලබමින් දකුණු ලක ප්‍රභූවරුන්ගේ අනුග්‍රහය ලබා තවත් සාමණේර හිමිවරුන් පස් නමක් සමග බුරුම රට අගනගරය වූ අමරපුරයට වැඩියහ.**

එහිදී ඤාණාභිවංස ධම්මසේනාපති නම් බුරුම සංඝරාජ හිමියන් උපාධ්‍යාය කොට ගනිමින් ස්වර්ණගුහා සීමාවේදී උපසම්පදාව ලැබූහ.

ඉන්පසු ලංකාවට පැමිණ 1803 වසරෙහිදී උපසම්පදා කිරීම් ආරම්භ කළහ. බුරුම රට අගනගරය වූ අමරපුරයේ උපසම්පදාව ලද බැවින් මෙම හිමිවරු අමරපුර සමාගම නමින් මුල් කාලයේ හඳුන්වන ලද අතර, පසු කලෙක අමරපුර නිකාය නමින් හැඳින්විය.

කතලුවේ ගුණරතන හිමි, අත්තුඩාවේ ධම්මරක්ඛිත හිමි, බෝගහපිටියේ ධම්මජෝති හිමි, කපුගම ධම්මක්ඛන්ධ හිමි යන ස්වාමින්ද්‍රයන් වහන්සේ ප්‍රභූවරුන්ගේ අනුග්‍රහය මත ස්වකීය අනුගාමික සංඝයා වහන්සේ පිරිස් සමග වෙන වෙන ම බුරුමය සහ රාමඤ්ඤ දේශය වෙත ගොස් උපසම්පදාව ලබා ලක්දිවට පැමිණ වෙන වෙන ම උපසම්පදා කිරීම් කටයුතු ආරම්භ කළහ. සියම් නිකායෙන් අමරපුර නිකාය වෙන් වීමට බලපෑ හේතු කවරේ දැයි මූලාශ්‍රවල තොරතුරු හෙළි වන නමුත්, නායකත්වය ගත් හිමිවරුන් පස් නමක් සමග දූත පිරිස් බුරුමයේ ගොස් වෙන වෙන ම උපසම්පදාව ලබා ලක්දිවට වැඩම කොට වෙන වෙන ම උපසම්පදා කටයුතු සිදු කිරීමට හේතු කවරේද යන්න පිළිබඳ විධිමත් ශාස්ත්‍රීය අධ්‍යයනයක් මේ දක්වා සිදු කොට නොමැත. රාජානුග්‍රහය නොමැති ව ,ජීවිත අවදානම නොතකා ඉමහත් අන්තරායකර ගමනක් වූ බුරුමයේ යාමට කණ්ඩායම් පහක් ඉදිරිපත් වීම සැබැවින් ම විස්මයජනක සිදුවීම් වෙයි.

ලක්දිව අමරපුර සමාගම පිහිටවූ වැලිතර මහකරාවේ ඤාණවිමලතිස්ස මහ තෙරුන් වහන්සේ බුරුමයේ අමරපුරදී උපසම්පදාව ලබා සියරට පැමිණ යළිත් බුරුමයට ගොස් ලාංකික අමරපුර සංඝයා වහන්සේලාගේ නායකත්වය වැලිතර හිමියන්ට පවරන ලෙස දන්වන ලද බුරුම රජුගේ නිර්දේශ ලිපිය එඩ්වඩ් බාන්ස් ලංකාණ්ඩුකාරවරයාට ඉදිරිපත් කළ පසු ලක්දිව මුහුදුබඩ තොටමුණුවල සිටින මහබද්දේ භික්ෂූන් වහන්සේලාගේ නායක පදවිය පිරිනමා 1825 වසරෙහිදී අක්ත පත්‍රයක් පිරිනමා ඇත. මහබද්දේ පැවිදි, උපසම්පදා සහ උපැවිදි වීම් මුන්වහන්සේගේ අවසරය මත සිදු විය යුතු බව දක්වා ඇත. මෙකී නායක පදවියට අවනත වීමට කතලුවේ හිමියන්ගේ සහ අත්තුඩාවේ හිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර අකමැති වූ හෙයින් එම කණ්ඩායම් සඳහා මෙම නායක පදවිය බල නොපැවැත්වෙන බවට ආණ්ඩුකාරවරයා ලිපියක් නිකුත් කොට ඇත.



අමරපුර නිකායේ ආදිකර්තෘ
**වැලිතර මහකරාවේ ඤාණවිමලතිස්ස මහා නාහිමි**

> අඹගස්වත්තේ සරණංකර හිමියන් ඇතුළු සංඝයා වහන්සේලා රාමඤ්ඤ දේශයට ගොස් උපසම්පදාව ලබා ලක්දිවට වැඩමවා 1864 වසරෙහි උපසම්පදා පිහිටුවා ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකාය පිහිටුවන ලදි.



රාමඤ්ඤ නිකායේ ආදිකර්තෘ
**අඹගහවත්තේ ඉන්ද්‍රාසභවරඤාණ මහාසාමි මහා නාහිමි**



වැලිතර නාහිමිපාණන් වහන්සේ ප්‍රථමයෙන් ලක්දිව අමරපුර මහානිකාය පිහිටුවීමට මූලික වූ ව ද එම හිමියන්ට ප්‍රථමයෙන් මෙරට ඉංග්‍රීසි ආණ්ඩුව මගින් අක්ත පත්‍රයක් පිරිනමා මහානායක පදවිය පුද කළේ කපුගම ධම්මක්ඛන්ධ මාහිමියන් වහන්සේ වෙත බව සඳහන් වෙයි. අමරපුර නිකායේ වෙනම සංඝ පරපුරක් ආරම්භ කිරීමට මුල් වූ කපුගම ධම්මක්ඛන්ධ හිමියන් ප්‍රථමයෙන් සියම් නිකායෙහි පැවිදි වී සිට පසුව සියම් නිකායෙන් ඉවත් ව උපසම්පදාපේක්ෂාවෙන් බුරුම රටට ගොස් උපසම්පදාව ලබා ලංකාවට වැඩමවා තම ශිෂ්‍ය පිරිස උපසම්පදාවෙහි පිහිටුවා එම සංඝ පිරිසෙහි නායකත්වයට පත් වූ හ. පසු කලෙක උපැවිදි වී ක්‍රිස්තියානි ආගම වැළඳගෙන ඉංග්‍රීසි ආණ්ඩුවේ තනතුරු දරා ඇත. උපැවිදි වී කිතු දහම වැළඳගත් මහානායක ස්වාමින්ද්‍රයන් වහන්සේ ලෙසින් මුන්වහන්සේ ඉතිහාස ගත වෙති. මුන්වහන්සේ ඇවෑමෙන් තත් ශිෂ්‍ය බෝපාගොඩ සිරි සුමන හිමියන් එම පරපුරෙහි නායකත්වයට පැමිණ ඇත.

පසු කලෙක බුරුම රට ශ්වේජින් නිකායික තෙරුන් වහන්සේලා ලක්දිවට වැඩම කරවීමෙන් පසු ඒ ඇසුරෙන් ශ්වේජින් නිකාය ලංකාවේ ද ආරම්භ කෙරුණි. මුල්කාලීන අමරපුර මහා නිකායේ එක් එක් ශාඛාවල නායක පදවි සුලභ නොවූ අතර, වස්කඩුවේ සුභූති හිමිපාණෝ එම නිකායේ කොළඹ පළාතේ සංඝ නායක පදවිය හෙබවූ බව සඳහන් ය.

පාර්ශ්ව රාශියකට බෙදී පැවතුණු අමරපුර මහානිකාය එක්සේසත් කිරීම පිණිස ඉතිහාසයේ කලින් කල විවිධ උත්සාහයන් ගෙන ඇත. පාර්ශ්ව තිස් ගණනකට බෙදී පැවතුණු අමරපුර නිකාය එක්සේසත් කිරීමේ එක් වැදගත් සංධිස්ථානයක් වශයෙන් පාර්ශ්ව කිහිපයක සහභාගීත්වයෙන් 1956 වසරේ එක්සත් අමරපුර සංඝසභාව පිහිටුවීම දැක්විය හැකි ය. අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහා නාහිමිපාණන් වහන්සේගේ පුරෝගාමිත්වයෙන් ශ්‍රී ලංකා අමරපුර මහා සංඝසභාව පිහිටුවා සියලු පාර්ශ්වයන්හි නායකත්වය සඳහා සභාපති හිමිනමක පත් කර ගැනීම ආරම්භ විය. වර්ෂ 1992දී සභාපති පදවියට වඩා උසස් උත්තරීතර මහානායක පදවිය පිහිටුවන ලදි.

අඹගස්වත්තේ සරණංකර හිමියන් ඇතුළු සංඝයා වහන්සේලා රාමඤ්ඤ දේශයට ගොස් උපසම්පදාව ලබා ලක්දිවට වැඩමවා 1864 වසරෙහි උපසම්පදා පිහිටුවා ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකාය පිහිටුවන ලදි. උපසම්පදාවෙන් පසු අඹගස්වත්තේ මාහිමියන් ඉන්ද්‍රාසභවරඤාණ සාමි යනුවෙන් හඳුන්වන ලදි. රාමඤ්ඤ නිකාය කිසිදු බෙදීමකට පත් නොවී එක් මහානායක හිමි නමකගේ නායකත්වය යටතේ පවතී. නිකායේ විධිමත් පරිපාලන ව්‍යුහයක් පවතී. රාමඤ්ඤ නිකායික භික්ෂූන් වහන්සේ අතර මෑතක් වන තුරුම පළාත් නායක පදවි නොපැවතුණු අතර, වර්තමානයේ පළාත් නවය සඳහා සංඝ නායක හිමිවරු පත් කොට ඇත. රාමඤ්ඤ නිකායේ පාලන සංවිධානය පිළිබඳ මාතලේ සාසනතිලක අනුනාහිමියෝ මෙසේ දක්වති.

“රාමඤ්ඤ නිකායේ විහාර නායක, පළාත් නායක පදවි නැත. ඒ වෙනුවට ඇත්තේ දිසාපාලක පදවි යි. පාලන අංශයේ සියලු කටයුතු මෙහෙයවන්නේ කාරක සභාව මගිනි. භික්ෂූන් අතර ඇති වන නඩු හබ විනිශ්චය කිරීම පිණිස අධිකරණ නායක කෙනෙකු යටතේ ඇති අනුවිජ්ජික අධිකරණ අංශයක් ඇත. අග්ගානුවිජ්ජක, උපරිම අනුවිජ්ජක නමින් පොදු විනිස්චය මණ්ඩල දෙකකි. දිසාපාලක නමින් පළාතේ ප්‍රධාන ස්ථවිරයන් වහන්සේ නමකගේ යටතේ සෙසු සංඝයා සිටිති. බහු නායකවරුන් මෙහි නැත.එක ම මහානායක කෙනෙකු යටතේ සියලු භික්ෂූන් වහන්සේලා සංවිධානය වී සිටිති”.

නිකාය හා පාර්ශ්වයක් ම පාහේ ස්වකීය හිමිවරුන් වෙත විවිධ ප්‍රදේශ වෙනුවෙන් නායක පදවි පිරිනැමීමත්, සුදුසුකම් අනුව ගෞරව නාම සම්මුති පිරිනැමීමත් සිදු කරනු ලබයි.

**දිමුතු පුන්සර කොළඹගේ**



# දුකසේ විඳිය යුතු බලවත් කර්ම විපාක

> "ස්වාමිනි, මම දැන් මියගොස් පනස් පස් අවුරුද්දක් වෙනවා. මේ තාක් මම කාපු කෑමක් හෝ බීපු බීමක් ගැන මට දැනීමක් නැහැ. අනේ ස්වාමිනි, මම ගොඩක් පිපාසයෙන් ඉන්නේ. මට පැන් ටිකක් ලබා දෙන සේක්වා!" යි ඉල්ලා සිටියා.

**ප්‍රේත ආත්මයක් ලබා උපදින්නේ මිනිස් ලොවෙහි දී කරන ලද බලවත් අකුසල කර්ම හේතු කරගෙන යි. ඇතැම් විට ඉතාම බලවත් අකුසල කර්ම හේතුකොට ගෙන සමහරු නිරයේ බොහෝ කලක් පැසී එයින් චුත ව ප්‍රේත ලෝකයේ ඉපදේ. සමහර අය මිනිස් ලොවෙන් චුත වෙද්දී ම ප්‍රේත ලෝකයේ ඉපදේ.**

ප්‍රේත ලෝකයේ ජීවත්වන ප්‍රේතයන්ට අපට මෙන් වෙන් වූ ලෝක නැත. ඒ ප්‍රේතයෝ පර්වත පා මුල, හිස් නිවාසවල, පාළු තැන්වල, සොහොන් පිටිවල ඕපපාතික ව ඉපදේ.

ප්‍රේත ලෝකයේ තොරතුරු අපට කියා දෙන්නේ ප්‍රේත වස්තු ග්‍රන්ථය තුළිනි. මිනිසා විසින් දූෂිත සිතින් යුතු ව සිත, කය, වචනයෙන් පව් කරන ලදුව එකී සා පිපාසයන්ගෙන් නිර්මිත වූ දුක්ඛිත ජීවිත ගැන අනුවේදනීය තොරතුරු එයින් හෙළි වේ. ඔවුන් ඉතා දුක් සහිත ලෙස සෙම්, සොටු, ලේ, සැරව ආදිය අනුභව කරමින් තම සා පිපාසා නිවා ගන්නට වෙහෙසෙන අයුරු හද කම්පා කරවන සුළු ය. එම තොරතුරු අසන විට මෙම අකුසල කර්මයන් කෙරෙහි බලවත් බියක් මෙන් ම, පිළිකුළක් ඇතිවීම නිතැතින් ම සිදු වෙයි.

ප්‍රේත වස්තුවෙහි සඳහන් වන උත්තරමාතු ප්‍රේත වස්තුව මෙසේ යි.

ඒ කාලයේ රට පාලනය කළ උදේනි රජතුමාගේ එක්තරා ඇමතිවරයෙක් මිය ගියා. ඒ ඇමැතිවරයාගේ උත්තර නම් පුතා, රජතුමා විසින් ඇමැතිවරයා කළ තනතුරටම පත්කරනු ලැබුවා. උත්තර ඇමැති දිනක් නගරයේ ප්‍රතිසංස්කරණ කටයුත සඳහා අවශ්‍ය ලී සෙවීමට වනයට ගියා. ඔහු මහා කාශ්‍යප රහතන් වහන්සේ වැඩ සිටි කුටිය වෙත ගියා. උන්වහන්සේගේ සරල ජීවිතය දැක, ඉරියව්වලට පැහැදී උන්වහන්සේ සමඟ පිළිසඳර කතාබහ කළා. එවිට උන්වහන්සේ උත්තර ඇමැතිවරයාට ධර්මය දේශනා කළා. බණ අසා තුනුරුවන් කෙරෙහි පැහැදී

"ස්වාමිනි, මා කෙරෙහි අනුකම්පාවෙන් හෙට දින මාගේ නිවසේ දානයට භික්ෂූන් වහන්සේ සමඟ වඩින සේකවා!" යි ආරාධනා කර සිටියා. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ඒ ආරාධනාව පිළිගත්තා. ඇමතිවරයා පසුදින කල්තබා ම ප්‍රණීත භෝජන පිළියෙළ කළා. මහා කශ්‍යප තෙරුන් වහන්සේ අනෙක් භික්ෂූන් වහන්සේ සමඟ වඩින පෙරමඟට ගියා. පාත්තරය ගෙන නිවසට කැඳවාගෙන විත් බොහෝ ගෞරවයෙන් පැණ වූ ආසන මත භික්ෂූන් වහන්සේ වැඩ හිඳුවා ප්‍රණීත ව සැකසූ දානය පූජා කළා. පසුව දෙහොත් මුදුන් තබාගෙන අනුමෝදනා දේශනාව ශ්‍රවණය කළා. ස්වාමීන් වහන්සේලාගේ පසුපසින් ම නුවර කොනට ගමන් කළා. එතැන නැවතී,

"ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ නිතර මගේ නිවසට දානය සඳහා වඩිනු මැනව" යි නැවත ද ආරාධනා කළා. උන්වහන්සේලා ඒ ආරාධනාව පිළිගත් බව දැනුන නිසා ඉතා සොම්නස් සිතින් නැවත නිවස වෙත පැමිණියා. ඔහු ආර්ය මහ සංඝ රත්නය කෙරෙහි ඉතාමත් ගෞරවයෙන් යුක්තව උන්වහන්සේලා ඇසුරු කළා. අවවාද ලබා ගෙන කටයුතු කළ නිසා නොබෝ කලකින් උත්තර තරුණයා සෝවාන් ඵලයට පත් වුණා. ඉතාමත් ශ්‍රද්ධාවෙන් ඔහු විහාරයක් ඉදිකළා. තමාගේ බොහෝ නෑයන් තුනුරුවන් කෙරෙහි පහදවා ශ්‍රද්ධාව ඇති කළා.

එහෙත් මේ තරුණයාගේ මව ඉතාමත් ම මසුරු යි. අකීකරු යි. තුනුරුවන් කෙරෙහි කිසිදු ශ්‍රද්ධාවක් නැති අහංකාර ස්ත්‍රියක්. ඇය තම පුතා කරන පින්කම්වලට විරුද්ධ වුණා. ඒවාට දෙස් නැගුවා. සාප කළා.

දිනක් ඇය බොහෝ සේ කිපුණා. ඇය තම පුතාට මෙසේ කියා සිටියා,

"ඔබ මේ මුඬු මහණුන්ට දානය දෙන්නේ මාගේ කැමැත්ත නො විමසා යි. මේ දේට මම අකැමැති යි. නුඹ මේ දෙන ආහාරපාන පරලොව දී ලේ බවට පත්වේවා!" යි සාප කළා. එහෙත් විහාරය සාදා පූජා කළ දිනයේදී උත්තරගේ මව ඒ පිළිබඳ පහන් සිතක් ඇති කරගෙන මොණර පිල් කළඹක් පිදුවා.

කාලකට පසු ඇය මියගොස් ප්‍රේත ලෝකයේ භයානක පෙනුමක් ඇති ප්‍රේතියක් ලෙස ඕපපාතිකව උපත ලැබුවා.

භාවනාවෙන් කාලය ගත කරන්නට ගං තෙරට වැඩි එක් තෙරුන් වහන්සේ නමක් වෙත මේ ප්‍රේතිය ආවා. ඇගේ කොණ්ඩය බොහෝ දිගුයි. බිම ඇතිල්ලෙනවා. කෙස්වලින් තමා ඒ ප්‍රේතිය ඇඟ වසාගෙන ඉන්නේ. ඇය මෙස් කියා සිටියා.

"ස්වාමිනි, මම දැන් මියගොස් පනස් පස් අවුරුද්දක් වෙනවා. මේ තාක් මම කාපු කෑමක් හෝ බීපු බීමක් ගැන මට දැනීමක් නැහැ. අනේ ස්වාමිනි, මම ගොඩක් පිපාසයෙන් ඉන්නේ. මට පැන් ටිකක් ලබා දෙන සේක්වා!" යි ඉල්ලා සිටියා.

"මේ තිබෙන්නේ සීතල දිය දහර ඇති ගංගා නදිය නෙව. හිමාල කන්දේ සිටයි මේ ගඟ ගලන්නේ. මේ ගඟෙන් පැන් අරගෙන පානය කරන්න. මගෙන් පැන් ඉල්ලා සිටින්නේ ඇයි?"

"අනේ ස්වාමිනි, මම පැන් ටිකක් බොන්නට ඕනෑ කියල ගඟට යනවා. එහෙත් ඒ වතුර ලේ බවට හැරෙනවා. මම ඒ නිසයි පැන් ටිකක් ඉල්ලුවේ."

"ඔබ කයෙන්, වචනයෙන්, මනසින් මොනවගේ පාපයක් ද කර ගත්තේ. ගංගාවේ ජලය ලේ බවට හරවන්නට තරම් විපාකයක් හැදුනේ කිනම් කර්මයක් නිසා ද?"

"මට හිටියා උත්තර කියා පුතෙක්. හරිම ශ්‍රද්ධාවන්ත යි. තෙරුවන් සරණ ගිය උපාසකයෙක්. ඔහු මම අකමැති වෙලා සිටිද්දී ම ශ්‍රමණයන් වහන්සේලාට දන් දුන්නා. සිවුරු, පිණ්ඩපාතය, සේනාසන, ගිලන්පස දුන්නා. මසුරුකමින් පෙළුණ මා ඔහුට නින්දා අපහාස කළා. දෙස් තිබ්බා. උඹ මම අකමැති ව සිටිද්දී ම නේද මෙසේ සිවුරු, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස දෙන්නේ. ඒයි උත්තර නුඹට පරලොව දී මේවා සියල්ල ම ලේ බවට පත්වේවා!" කියා සාප කළා. ඒ කර්ම විපාකය නිසයි ගංගා ජලය මට ලේ බවට පත්වන්නේ.

ප්‍රේතිය කෙරෙහි අනුකම්පාව උපදවා ගත් තෙරුන් වහන්සේ ඇයට පින් පිණිස භික්ෂූන් වහන්සේලාට පැන් පූජා කළා. පිඬුසිඟා වැඩ දානය පූජා කළා. සිවුරු, බෙහෙත් පූජා කළා. ඒ විපාක වශයෙන් ඒ ප්‍රේතියට දිව්‍ය සැප ලැබුණා. ඇය ඒ සියලු දේ තෙරුන් වහන්සේ ඉදිරියට පැමිණ කියා සිටියා.

තෙරුන් වහන්සේ විසින් ඒ පුවත මහා සංඝ රත්නයට වදාළා. එය ඇසූ බොහෝ දෙනා මසුරු මල දුරු කොට දස කුසල්හි යෙදී ධර්මයෙහි හැසිරුණා.

නයනා නිල්මිණී

## බුත්තල සියලුම විහාරස්ථානවලට වියළි ආහාර ද්‍රව්‍ය



කොවිඩ් 19 වසංගතය හේතුවෙන් විහාරස්ථානවලට දායක දායිකාවන්ගේ පැමිණීම අඩුවීම නිසා බුත්තල ප්‍රදේශයේ සියලුම විහාරස්ථානවලට අවශ්‍ය වියළි ආහාර ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කෙරිණි. බෞද්ධ කටයුතු කොමසාරිස් දෙපාර්තුමේන්තුවේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෞද්ධ කටයුතු සමායෝජක, සියම් මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ, මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංඝ නායක බුත්තල යුදගනාව රජමහා විහාරාධිපති ගල්ටැම්වත්තේ නන්දරතන ස්වාමීන් වහන්සේගේ ඉල්ලීමක් පරිදි මාතර ප්‍රදේශයේ පරිත්‍යාගශීලීන් පිරිසක් පියවර ගෙන ඇත.

එම වියළි ආහාර ද්‍රව්‍ය විහාරාධිපති ස්වාමීන් වහන්සේ වෙත භාරදුන් අවස්ථාවයි මේ. මෙම අවස්ථාවට බුත්තල ප්‍රදේශයේ මහා සංඝරත්නය වැඩමකර සිටියහ.

ඩී.එස් ගුණතිලක ඌව වෙල්ලස්ස විශේෂ

## පූලියද්දේ සුධම්ම හිමියන් වෙනුවෙන් අනුරාධපුරයේ දී පින්කම්

කොරෝනා වෛරසය ආසාදිත ව අපවත්වී වදාළ හන්තාන සිරිධම්මරතන ත්‍රිපිටක ධර්මායතනාධිපති පූලියද්දේ සුධම්ම හිමියන් වෙනුවෙන් අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි විහාරස්ථානයේ දී සහ අනුරාධපුර උණගස්වැව, වේලුවනගම, අංක 38 හි පිහිටි අනුරාධපුර සදහම් සෙවණ භාවනා මධ්‍යස්ථානයේ දී දින දෙකක් පින්කම් පවත්වන ලදී.

මෙම පින්කම්වලට අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි විහාරස්ථානයේ දී සවස ගිලන්පස බුද්ධ පූජාවක් සහ සර්වරාත්‍රික විදුලි ආලෝක පූජාවක් ද, අනුරාධපුර සදහම් සෙවණ භාවනා මධ්‍යස්ථානයේ දී සවස ගිලන්පස බුද්ධ පූජාවක් සහ පසුදින උදෑසන කිරි ආහාර සහ පිරිකර සහිත බුද්ධ පූජාවක් ද ඇතුළත් විය.



අනුරාධපුර සදහම් සෙවණ භාවනා මධ්‍යස්ථානයේ භාවනා උපදේශක සහ විශ්‍රාමික අධ්‍යාපනඥ රෝහිත විජයතිලක මහතා විසින් සංවිධානය කරන ලද මෙම පින්කම් සඳහා දායකත්වය ලබාදෙන ලද්දේ හෝමාගම දිල්හානි හෙට්ටිගේ මහත්මිය විසිනි.









**කොවිඩ් වසංගත රෝගය නිසා ලෝකය පුරා රෝගී වී සිටින ජනතාවට නිරෝගී සුවය ප්‍රාර්ථනා කරමින් සෙත් පැතිමේ ප්‍රාර්ථනා පින්කමක් හිඟුරාන ඓතිහාසික උත්තර ජයමහා විහාරස්ථානයේ දී පසුගියදා පැවැත්විණි. ඖෂධ හා ගිලන්පස පූජාවන්, ආලෝක පූජාව සහිත ආශිර්වාද බෝධිපූජා පින්කම මෙහිදී සිදු කෙරිණි. ඓතිහාසික හිඟුරාන උත්තර ජයමහා විහාරාධිපති හිඟුරාණේ සිරිධම්ම නායක හිමියන්ගේ ප්‍රධානත්වයෙන් මෙම පින්කම සිදු කෙරිණි.**

*(දමන සමූහ කේ.ඒ.මෛත්‍රීපාල.)*

## පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලු පිරිවෙන්වලට ප්‍රත්‍ය පහසුකම්



කොවිඩ් 19 වසංගතයෙන් පීඩාවට පත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලු පිරිවෙන් සඳහා ප්‍රත්‍ය පහසුකම් සැපයීමට මැලේසියාවේ මහා කරුණා පදනම විසින් පියවර ගෙන තිබුණි. එහි අධ්‍යක්ෂ ජෙනරාල් බූටාවත්තේ සරණංකර නා හිමියන් විසින් මෙම ප්‍රදානයන් සිදු කරන ලද අතර, ලෝක තරුණ බෞද්ධ සංඝ සභාවේ මහලේකම් මුගුණුවෙල අනුරුද්ධ හිමියන්ගේ පූර්ණ සංවිධානයෙන් හා පොළො ාන්නරුව පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ දමුණුපොළ අනුරුද්ධ හිමියන්ගේ සහභාගිත්වයෙන් මේ කටයුතු සිදු කරන ලදී. දිඹුලාගල පිරිවෙනේ දී අදාළ ප්‍රත්‍ය පහසුකම් මුගුණුවෙල අනුරුද්ධ නා හිමියන් විසින් පරීක්ෂා කර බැලූ අවස්ථාව හා පිරිවෙනක් සඳහා අදාළ ප්‍රත්‍ය පහසුකම් පිරිනැමූ ආකාරය සේයාරුවලින් දැක්වේ

## ලේ දන්දීමේ පින්කමක්

බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ බිබිල යෞවන සමාජ ප්‍රාදේශීය බල මණ්ඩලය එක්ව සංවිධානය කළ ලේ දන්දීමේ පින්කමක් පසුගිය දා (04) බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.

එහිදී පරිත්‍යාගශීලීන් ලේ දන් දුන් අවස්ථාව ඡායාරූපවලින් දැක්වේ. බිබිල ප්‍රාදේශීය ලේකම් උපේක්ෂා නයනී විජේසිංහ මහත්මිය ද මෙම අවස්ථාවට සහභාගී විය.

ඩී.එස් ගුණතිලක ඌව වෙල්ලස්ස විශේෂ





# මිත්‍ර සෙනෙවිගෙන් සිරිනාගට තර්ජනයක්



**පසුදා හිමිදිරියේ ම අවදි වී විජිතපුරයෙන් පිට වූ සිරිනාග දවල් බතට නිවසට පැමිණියේ ය. එතැන් සිට මාස දෙකකට ආසන්න කාලයක් මිත්‍ර මහ සෙනෙවි මඟ හැර ඉන්නට කටයුතු කළේ ය. රාජකාරි බහුල ව යෙදෙන්නකු සේ හැසිරුණේ ය. මිත්‍ර සෙනෙවි පැමිණියහොත් තමා නිවසෙහි සිටියත් නැති බව පවසන ලෙසට සේවකයන්ට අණ කර තිබිණි.**

එහෙත් එක් සන්ධ්‍යාවක සිරිනාග පසු පසින් පැමිණි මිත්‍ර සෙනෙවි ඔහු හසුකර ගත්තේ ය.

"සිරිනාග" මිත්‍රගේ ඇමතීමෙන් සිරිනාග බියට පත් විය. සිය අසු නවතා ගත් ඔහු තමා ළඟට පැමිණි මිත්‍ර මහා සෙනෙවිතුමාට ආචාර සම්පන්න ව කතා කළේ ය.

"මහා සෙනෙවිතුමනි, ළඟට එනතුරු ම මා දුටුවේ නැහැ."

"තොප නිතර ම මා මඟහැර යන්නට උත්සාහ කරන්නේ ඇයි ?"

"පසුගිය සති කිහිපයක කාලය පුරා ම මම විවේකයක් නො ගෙන ම කටයුතු කළේ මට පැවරුණු රාජකාරි කටයුතු අවසන් කරන්න යි. තව දින දෙකකින් පමණ එම වාර්තාව රජතුමාට භාරදීමට සිතාගෙන සිටිනවා."

"එය රජතුමාට දෙන්නට පෙර මට බලන්නට ඕනෑ."

"මහ සෙනෙවිතුමනි, එය රහසිගත වාර්තාවක්"

"මා දන්නවා. ඒ නිසා ම මට එය බැලිය යුතුයි"

"හොඳයි. මා එසේ කරන්නම්"

"තොප දින දෙකක් අනුරාධපුරයේ සිටි බව දැන ගන්නට ලැබුණා"

"දීඝාභය සෙනෙවිතුමාගේ කැඳවීමකට එහි ගියා."

"තොප පුෂ්පනාථ වෛද්‍යවරයා හමුවූයේ කුමකට ද?"

"මහ සෙනෙවිතුමනි, දින කිහිපයක සිට ඇති වී තිබෙන හිස ඇම්මක් නිසා එයට ප්‍රතිකාරයක් ලබා ගන්නටයි ගියේ"

"මට දීර්ඝ කාලයක සිට හිස ඇම්මක් තියෙනවා. මේ වෙදාට බැහැ එය සුව කරන්නට"

"ඔහු දුන් කල්කයකින් හා සුවඳ කුඩකින් මගේ හිස ඇම්ම සුව වී ගියා මහා ඇමතිතුමනි"

"සිරිනාග, තොප වැඩ කරන්නේ කාට වුවමනා හැටියට ද? තොප කවුරුන් කියා අමතක ද? තොප යන එන ගමන්, කරන වැඩකටයුතු මා දැන ගන්නට ඕනෑ."

"හොඳමයි, මහා සෙනෙවිතුමනි"

"මා දැන් වෙනත් හදිසි රාජකාරියකට යනවා. අද රාත්‍රියෙහි නොවරදවා ම මා හමුවන්නට ඕනෑ."

"හොඳමයි මහා සෙනෙවිතුමනි "

"මහා සෙනෙවි, තමන් සමග මහත් කෝපයෙන් පසුවන බව වටහාගත් සිරිනාග තුළ ඇතිවූයේ බියකි. නිවසට ගොස් මුහුණ කට සෝදාගත් ඔහු නිදියහනට වී බර කල්පනාවකට වැටුණේ ය.

මහා සෙනෙවි මන්දිරයට යනවා ද? නැද්ද? බොහෝ වේලා දෙගිඩියාවෙන් කල්පනා කරමින් සිටි සිරිනාග කුමක් වුවත් එහි යාමට තීරණය කළේ ය. ඔහු සන්ධ්‍යාවෙහි මුහුණ පෑ ගැටලුව ගැන ජයනාථ මහා සිටුතුමාට කීවේ ය. මිත්‍ර මහා සෙනෙවිගේ ඉල්ලීම ඉටු කරන්නට සිදු වන නිසා රාත්‍රියෙහි එහි ගොස් එන්නට සිදු වී ඇති බව පැවසුවේ ය.

"ඔව්, නොගියොත් ඔහු කේන්ති ගනීවි. පළිගන්නට හිතාවි. ඒ නිසා යන්න. ඉවසීමෙන් කතා බහ කරන්න. ඔහුට එකඟ වෙන්න. ඔහුගේ විශ්වාසය දිනා ගැනීමට උත්සාහ ගන්න." ජයනාථ සිටුතුමා උපදෙස් දුන්නේ ය.

ඔහු මහා සෙනෙවි මැදුරට යන විට මිත්‍ර සිටියේ ඔහුගේ පැමිණීම අපේක්ෂාවෙනි. නොඉවසිල්ලෙන් සිටි මිත්‍ර මහා සෙනෙවි ආලින්දයේ දී ම සිරිනාග පිළිගෙන තමන්ගේ නිල කුටියට කැඳවාගෙන ගියේ ය. ඔහුගේ කතාව පටන් ගත්තේ ය.

"සිරිනාග, තොපට ඉක්මනින් මුල අමතක වෙනවා. තාත්තාගේ සෙනෙහස නො ලබන විට, මෙහි කැඳවාගෙන විත් යුද ශිල්ප, භාෂා ශාස්ත්‍ර උගන්වා හොඳ පුහුණුවක් ලබා දී උප සෙනෙවියකු කළේ මම යි."

මීට පෙර අවස්ථා කිහිපයක දී ම තමන් විසින් පිළිගන්නා ලද කරුණු නැවත නැවත සඳහන් කරමින් මොහු වෑයම් කරන්නේ තමා වහලකුගේ තත්ත්වයට පත් කර ගන්නට බව වැටහුණි. ඔහුගේ සිතෙහි හටගත්තේ කෝපයකි. එහෙත් ඔහු ඒ බවක් නො පෙන්වා කතා කළේ ය.

"ඇත්ත මහා සෙනෙවිතුමනි, මගේ පියාට වඩා මම ඔබ අගය කරනවා කරනවා. ඔබගේ අවවාද අනුශාසනාවලින් බැහැර ව කිසිවක් කිරීමේ අදහසක් මගේ නැහැ"

"තොප කියන්නේ බොරු. දැන් තොප බලාපොරොත්තු වෙන්නේ මගේ සතුරන්ගේ උපකාර. ඔවුන්ගේ ඇසුර." මිත්‍ර කතා කළේ ආවේගශීලී ව බව සිරිනාගට හැඟිණි.

"මහා සෙනෙවිතුමනි, ඔබතුමා යෝජනා කළ පරිදි ලැබුණු ඇතුළු නුවර ආරක්ෂක කටයුතු මේ සතිය තුළ පටන් ගන්නට මා අදහස් කරනවා."

"තොපට එම වගකීම පැවරෙන්නේ නැහැ. දීඝජන්තු තොප වෙනුවට එළාර රජතුමාගේ බෑණනුවන් කෙනකුට එම කාර්යය පවරන්නට තීරණය කරලා. රජතුමාත් එය අනුමත කරලා. තොප එම නිල නිවසට පැමිණියේ නැහැ. ඒ විතරක් නොවෙයි. තොප එම නිල නිවස තුණ්ඩිලට පවරන්නට කැමැත්ත පළ කරලා. මගේ විමසීමකින් තොරව තොප කළ එම කාර්යය ඉතාම නින්දිතයි."

"තුණ්ඩිලට ඇතුළු නුවර ආරක්ෂාව පැවරෙන්නේ නම්, එම නිල නිවාසය ඔහුට හිමි විය යුතු බවයි මම කල්පනා කළේ. ඔවුන් මට වෙනත් තනතුරක් ලබා දෙයි."

"තොපට තනතුරු පවරන්නෙත්, රාජකාරි නියම කරන්නෙත් වෙන කිසිවෙක් නොවෙයි. මම යි. මගේ නිර්දේශයන් පමණයි මහරජතුමා අනුමත කරන්නේ."

"අනුරාධපුර රාජධානිය තුළ සිදු වූ කොල්ලකෑම් හා ඝාතන ගැන තොප ඉදිරිපත් කරන සමීක්ෂණ වාර්තාව රජතුමා වෙත ඉදිරිපත් කරන්නේ මමයි."

"එහි වරදක් නැහැ සෙනෙවිතුමනි, ඉදිරි දින කිහිපය ඇතුළත එම වාර්තා දෙක ම ඔබතුමාට භාර දෙන්නට පුළුවන්."

මිත්‍ර සෙනෙවිගේ ස්වරූපය සුහදශීලි නොවන බව සිරිනාගට සිතිණි. කුමක් හෝ දැඩි වරදක් අල්ලාගෙන ඔහු සූදානම් වන්නේ තමාගෙන් පළිගන්නට බව ඔහුට සිතිණි. දැන් ඔහුගේ සිත පවසන්නේ වහාම මේ මන්දිරයෙන් පැන ගැනීම සුදුසුයි යන්නයි.

මේ අවස්ථාවේ වාසනාවකට මෙන් පුණ්ණා පැමිණ පියා හමුවීමට අමුත්තකු පැමිණ ඇති බව කීවා ය. ඔහු කුටියෙන් බැහැරට ගියේ ය. සිරිනාග කල්පනාවට වැටුණේ ය.

මිත්‍ර සෙනෙවි කුටියට ඇතුළු විය. සිරිනාගගේ ඇස කිහිපවරක් ම ඔහුගේ කඩුව වෙත දිවීය.

"මට මොහොතකට එළියට යන්න සිදුවෙලා තිබෙනවා. තොප සමග කළ යුතු කතාබහ තවම ඉවර නැහැ. මා එනතුරු රැඳී සිටුව".

ඔහු තදබල අණක් ලෙස කියමින් පිටව ගියේ ය. සිරිනාග පත්වුණේ මහත් අපහසු තත්ත්වයකට ය. පුණ්ණා විසින් ගෙන එන ලද මී පැණි බඳුන එකවර හිස් කළ ඔහු ආලින්දයට පැමිණියේ ය. එතැනින් මිදුලට බැස උද්‍යානය වෙත ගොස් බංකුවක හිඳ ගත්තේ ය.

සිතන්නට බොහෝ දේ ඔහුට ඇත. ගැලවී යන්නට මඟක් සොයා ගත යුතු යැයි සිතේ. ඉදිරි අඩ හෝරාව කිසියම් භයානක අවස්ථාවකට තමා ගොදුරු වන බව ඔහුට නිසැක ය.

මිත්‍ර මහා සෙනෙවි, ගෝපුර ද්වාරයෙන් ඇතුළු වනු දුටු සිරිනාග වහා මන්දිරයට ගොස් මිත්‍රගේ නිල කුටියේ තමන් සිටි අසුනෙහි හිඳ ගත්තේ ය. මිත්‍ර සෙනෙවි තවමත් කෝපයෙන් පසුවන බවක් පෙනේ. ඔහු ළඟින් මත් පැන් ගඳක් ද වහනය විය. ඔහු යන්නට ඇත්තේ ඔහුගේ තානායමට බව සිරිනාගට සිතිණි. තම ඉණ රැඳි කඩුව කොපුවත් සමගම අසල වූ සෝපාව මතට විසි කළේ ය. එය සිරිනාගගේ උරහිස තුවාල කරමින් බිම ඇද වැටිණි. සිරිනාග එය අහුලා සෝපාව මත තැබීය.

"රාත්‍රී භෝජනය සූදානම්." පුණ්ණාගේ මව පැමිණ කීවා ය.

මිත්‍රගේ ඇස් කඩුව වෙත දිවෙනු සිරිනාගට දැක ගත හැකි විය. ඔහුට ජීවිතය පිළිබඳ බියක් ඇති විය.

"අපි රාත්‍රී භෝජනයෙන් පසුව කතා කරමු. සිරිනාගත් සමග ම මට එළියට යාමට උවමනාවක් තිබෙනවා"

මිත්‍ර සෙනෙවි නැඟී සිටියා ය. ඒ සමග ම නැඟී සිටි සිරිනාග මිත්‍රගේ කඩුව කොපුවෙන් ගලවා ගත්තේ ය.

**අයන්ති විතාන**


# යාපහුව පුරවරයට ආලෝකයක් වූ මහව උඩගම ශ්‍රී ඉන්දසුමන මහ පිරිවෙන් විහාරස්ථානය





කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඓතිහාසික යාපහුව පුරවරයේ කටුවන්නා කෝරළයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහව උඩගම ශ්‍රී ඉන්දසුමන මහ පිරිවෙන් විහාරස්ථානය පිහිටා තිබේ. 1995.05.10 දී ආරම්භ කරන ලද ඉහත පිරිවෙන් විහාරස්ථානයේ නිර්මාතෘ වන්නේ දැනට අනුපස් වැනි වියෙහි පසුවන පිරිවෙන් විහාරස්ථානය ප්‍රමුඛ එම සියලු විහාරස්ථානයන්හි අධිපති, වන්නි දෙමළ හත්පත්තු දෙකේ සංඝනායක බළල්ලේ ශ්‍රී පඤ්ඤාලෝකාභිධාන නායක නාහිමිපාණන් වහන්සේ යි. උන්වහන්සේ සියලු වගකීම් තම වැඩිමල් ශිෂ්‍ය වූ ශ්‍රී ඉන්දසුමන පිරිවෙනෙහි වර්තමාන කෘත්‍යාධිකාරී රැකෝගම සිරිනිවාස නායක ස්වාමීන් වහන්සේට පවරා දැනට වලස්සෑගල පුරාණ විහාරස්ථානයෙහි විවේක සුවයෙන් වැඩ වෙසෙති.

පිරිවෙන් විහාරස්ථානය ප්‍රමුඛ සියලු විහාරස්ථානයන්හි වගකීම් කරට ගෙන ඒවා පිළිබඳ සොයා බලා කටයුතු කරන්නේ රැකෝගම සිරිනිවාස නායක ස්වාමීන් වහන්සේ යි. උන්වහන්සේ පිරිවෙන් විහාරස්ථානයෙහි වැඩ වෙසෙමින් ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලාගේ ත්, දායක පින්වතුන්ගේ ත් සියලු වගකීම් නොපිරිහෙලා ඉටු කරති. මහව උඩගම ශ්‍රී ඉන්දසුමන මහා පිරිවෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ පවා ප්‍රසාදයට ලක් වූ පිරිවෙනකි. කුඩා ස්වාමීන් වහන්සේලා 40කට අධික සංඛ්‍යාවක් වැඩ වසන එම පිරිවෙනෙහි දෛනික සියලු කටයුතු කාල සටහනකට අනුව සිදු වේ. ඒ අතර සුවිශේෂී සිද්ධියක් ලෙස දවසට තුන් වතාවක් බුද්ධ වන්දනාව සිදු කිරීම පෙන්වා දීමට පුළුවන. ප්‍රදේශවාසී සැදැහැතියන්ගේ සියලු ආගමික කටයුතුවලට පිරිවෙන් විහාරස්ථානයෙන් සිදුවන අනුපමේය මෙහෙය ඉතා විශාල ය. ඒ සියලු කාර්යයන් සඳහා නායකත්වයත්, අනුශාසකත්වයත් ලබා දෙන්නේ වර්තමාන පිරිවෙන් කෘත්‍යාධිකාරි රැකෝගම සිරිනිවාස නායක ස්වාමීන් වහන්සේ යි. උන්වහන්සේගේ වැඩපිළිවෙළ අගය කරමින් සැදැහැති දායක පින්වතුන් හා ප්‍රදේශවාසී පින්වතුන් නිරතුරුව ම විහාරස්ථානයට පැමිණෙති. ශ්‍රද්ධා සිතින් ආගමික වතාවත්හි නිරත වෙති. උන්වහන්සේගේ අවවාද අනුශාසනා ලැබ යහපත් ජීවිත ගත කරති.




වර්තමාන කෘත්‍යාධිකාරී රැකෝගම සිරිනිවාස නායක ස්වාමීන් වහන්සේ

මහව උඩගම ශ්‍රී ඉන්දසුමන මහ පිරිවෙන් විහාරස්ථානය පිහිටා තිබෙන්නේ ඉතා මනරම් භූමි භාගයක ය. මහව ප්‍රධාන දුම්රියපළට ආසන්න ව පිහිටා ඇති පිරිවෙන් විහාරස්ථානය තුළ මනරම් වැව් පොකුණක් මධ්‍යයේ මුචලින්ද නාග දරණ මත බුද්ධ ප්‍රතිමා වහන්සේ තේජසින් වැඩ වසන ආකාරය කාගෙත් සිත් නෙත් ඇඳ බැඳ තබන්නකි.

සැදැහැවතුන්ගේ දහම් පවස නිවීමට තෝතැන්නක් වූ පිරිවෙන් විහාරස්ථානය සැදැහැවතුන්ට පින් කිරීමට සුදුසු ම පුණ්‍ය භූමියකි.



පිරිවෙනේ නේවාසික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ



"මහව උඩගම ශ්‍රී ඉන්දසුමන මහ පිරිවෙන් විහාරස්ථානය පිහිටා තිබෙන්නේ ඉතා මනරම් භූමි භාගයක ය. මහව ප්‍රධාන දුම්රියපළට ආසන්න ව පිහිටා ඇති පිරිවෙන් විහාරස්ථානය තුළ මනරම් වැව් පොකුණක් මධ්‍යයේ මුචලින්ද නාග දරණ මත බුද්ධ ප්‍රතිමා වහන්සේ තේජසින් වැඩ වසන ආකාරය කාගෙත් සිත් නෙත් ඇඳ බැඳ තබන්නකි."

ප්‍රවීණාචාර්ය ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛන ශාස්ත්‍රී
**ගලගෙදර රතනවංස හිමි**

වර්ෂ 2021 ක් වූ ඔක්තෝබර් 13 බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.